

# කඳුළු ගෑස්

# මිලියන විසි ගණනක කඳුළු

වසර 10කට ආසන්න කාලයක් ශ්‍රී ලංකාවේ කඳුළු ගෑස් භාවිතය
සම්බන්ධයෙන් මාස 10ක් පුරා කළ සොයා බැලීමක වාර්තාව

**සමාජය සහ සාමයික කේන්ද්‍රයේ පර්යේෂණ කණ්ඩායම**

# කඳුළු ගෑස්
# මිලියන විසි ගණනක කඳුළු

ශ්‍රී ලංකාවේ වසර 10ක් තුල කඳුළු ගෑස් භාවිතය ගැන මාස 10කදී කළ සොයා බැලීමකින් පසු සකස් කරන ලද වාර්තාව



# කඳුළු ගෑස්
# මිලියන විසි ගණනක කඳුළු

ශ්‍රී ලංකාවේ වසර 10ක් තුල කඳුළු ගෑස් භාවිතය ගැන මාස 10කදී කළ සොයා බැලීමකින් පසු සකස් කරන ලද වාර්තාව

අධීක්ෂණය
රොහාන් සිල්වා පියතුමා
රුකී ප්‍රනාන්දු
නීතිඥ සුරේන් ඩී පෙරේරා

තොරතුරු ගවේෂණය
තරිඳු ජයවර්ධන
නීතිඥ මනුෂිකා කුරේ
ෆාතිමා රස්මා

තොරතුරු විශ්ලේෂණය සහ සංස්කරණය
තරිඳු ජයවර්ධන
tharindu.rti@gmail.com
0710 66 14 17 (WhatsApp)

පිටු සැකසුම සහ පිටකවර නිර්මාණය
සෙනුර ලක්මාල්

ප්‍රකාශනය
සමාජය සහ සාමයික කේන්ද්‍රයේ පර්යේෂණ කණ්ඩායම

# පටුන

සංස්කාරක සටහන......vii
ශ්‍රී ලංකාවේ උද්ඝෝෂණා ......11
තොරතුරු රැස් කිරීම..........13
කඳුළු ගෑස් .................21
ශ්‍රී ලංකාවේ කඳුළු ගෑස් භාවිතය.........23
කඳුළු ගෑස් මිලදී ගැනීම..............26
කඳුළු ගෑස්වල අන්තර්ගතය................29
2012 සිට 2022 දක්වා කඳුළු ගෑස් භාවිතය......................31
2022 වසරේ දී කඳුළු ගෑස් භාවිතය.....32
අධික ප්‍රමාණවලින් උද්ඝෝෂණවලින් කඳුළු ගෑස් එල්ල කිරීම................................33
කල් ඉකුත් වූ කඳුළු ගෑස්.............................37
කඳුළු ගෑස් සම්බන්ධයෙන් අන්තර් ජාතික මගපෙන්වීම්........................................41
සොයා ගැනීම් කෙටියෙන් ..................44

ඇමුණුම්



# සංස්කාරක සටහන

ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසයේ වැඩිම කඳුළු ගෑස් ප්‍රමාණයක් එල්ල කළ වසර ලෙස 2022 වසර දැක්විය හැකිය. ආණ්ඩුවේ අත්තනෝමතික තීරණ හේතුවෙන් පුරවැසියන්ට ජීවත්වීමට නොහැකි තත්ත්වයක් උදාවීමට එරෙහිව 2022 වසරේ මාර්තු 31 වැනිදා එවකට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ නිවස ඉදිරිපිට පැවැති විරෝධතාවට එල්ල කළ කඳුළු ගෑස් ප්‍රහාරයට ලක්වූවන් බොහෝ දෙනෙකු විවිධ ආසාත්මිකතා වලට ලක්වූ බවට වාර්තා විය. ඒ සමඟම කඳුළු ගෑස් සම්බන්ධයෙන් සොයා බැලිය යුතු යැයි අප අතරේ සාකච්ඡාවක් තිබුණ ද එය ආරම්භ වූයේ 2022 මැයි මාසයේ දී ය.එය සොයා බැලූ ආකාරයත, තොරතුරු පනත ඊට භාවිත කළ ආකාරයත්, පොලිසියේ පරස්පර ප්‍රතිචාර ගැනත්, අපේ සොයා බැලීමේදී අනාවරණය කර ගත හැකි වූ තොරතුරුත් කෙටියෙන් මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

මෙම වාර්තාව කෙටි වාර්තාවකි. මෙම සොයා බැලීමේදී අනාවරණය වූ කාරණා ගැන පරිච්ඡේද ගණන් ලිවිය හැකි වුවත් මෙම අවස්ථාවේ වැදගත් වන්නේ විරෝධතා මර්දනය කිරීමට කඳුළු ගෑස් භාවිත කළ ආකාරය කෙසේදැයි යන්න දැන ගැනීමට අත්‍යාවශ්‍ය කරුණු හෙළිදරව් කිරීම පමණක් යැයි අපි විශ්වාස කරමු. කෙටියෙන් වුවද අදාල තොරතුරු ඉදිරිපත් කිරීම මගින් සෑම ආණ්ඩුවක්ම පාහේ විලාසිතාවක් බවට පත් කර ගෙන ඇති කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම නතර කිරීමට අවශ්‍ය බලපෑම් කිරීම අපගේ අරමුණයි.ශ්‍රී ලංකා උද්ඝෝෂකයන් වෙත කඳුළු ගෑස් මුවාවෙන් අධික විෂ සහිත රසායන ප්‍රහාර එල්ල කිරීම නතර කිරීම සඳහා පෙරට එන ලෙස සියලු පාර්ශ්වවලින් ඉල්ලා සිටිමු.

ස්තුතියි.

තරිඳු ජයවර්ධන
සමාජය සහ සාමයික කේන්ද්‍රයේ පර්යේෂණ කණ්ඩායම වෙනුවෙන්
csr.rti281@gmail.com / tharindu.rti@gmail@com
0710 66 14 17 (whatsapp)



# ශ්‍රී ලංකාවේ උද්ඝෝෂණ

## 2012 සිට 2022 දක්වා ශ්‍රී ලංකාවේ උද්ඝෝෂණ.



2010 ජනාධිපතිවරණයෙන් පසු මහින්ද රාජපක්ෂ මහතාගේ ජනාධිපති ධුරයේ දෙවැනි කාලපරිච්ඡේදයේදී ශ්‍රී ලංකාවේ විරෝධතා රැසක් පැවැත්විණි. ඉන් වඩාත්ම කතා බහට ලක්වූ උද්ඝෝෂණ තුන ලෙස කටුනායක වෙළඳ කලාපයේ පැවැති උද්ඝෝෂණය, හලාවත ධීවර උද්ඝෝෂණය සහ ගම්පහ වැලිවේරියේ රතුපස්වල උද්ඝෝෂණය සැලකිය හැකිය. එම උද්ඝෝෂණ වඩාත් කතා බහට ලක්වූයේ එම උද්ඝෝෂණ විසිරුවා හැරීම සඳහා වෙඩි තැබීම සහ එලෙස වෙඩි තැබීම නිසා පුද්ගලයන් පස් දෙනෙක් ඝාතනය වීම නිසාය.




කටුනායක වෙළඳ කලාපයේ සේවක සේවිකාවන් 2011 වසරේදී කළ විරෝධතාවයක් විසිරුවා හැරීම සඳහා පොලිසිය කළ වෙඩි තැබීම නිසා ඇඟළුම් සේවකයකු වූ රොෂේන් චානක මිය ගියේය. ඊට වසරකට පමණ පසු 2012 දී ධීවරයන් පිරිසක් හලාවතදී පැවැත්වූ විරෝධතාවකට වෙඩි තැබීම නිසා ඇන්තනී ප්‍රනාන්දු නම් 28 හැවිරිදි ධීවරයෙක් මිය ගියේය. එම සිදුවීමෙන් වසරකට පමණ පසු 2013 වසරේදී ගම්පහ වැලිවේරියේ උද්ඝෝෂණයකට යුද හමුදාව ලවා වෙඩි තැබීම නිසා පාසල් සිසුන් දෙදෙනෙක් ඇතුළු තිදෙනෙක් මිය ගියහ.

එම ප්‍රධාන සිදුවීම් දෙකට අමතරව අදාල කාල පරිච්ඡේදයේ දී කතා බහට ලක්වූ තවත් විරෝධතාවක් වූයේ අලුත්ගම දර්ගා නගරයේ පැවැති විරෝධතාවයයි. එම සිදුවීමේදී ද වෙඩි තැබීමක් වූ බව මාධ්‍ය වාර්තා කළේය.

2015 වසරේ ජනවාරි අට වැනිදා පැවැති ජනාධිපතිවරණයෙන් මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපතිවරයා ලෙස තේරී

පත්වීමෙන් පසු එවකට විපක්ෂය මෙන්ම සිවිල් සංවිධානට විරෝධතා සහ උද්ඝෝෂණ පැවැත්වීය. ඒ කෙසේ වෙතත් මෑත ඉතිහාසයේ ලංකාවේ වැඩිව විරෝධතා ප්‍රමාණයක් පැවැතියේ 2019 නොවැම්බර් මාසයේදී ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති ධුරයට පත්වීමෙන් පසුවය.

ආණ්ඩුවේ අත්තනෝමතික තීරණ නිසා පීඩාවට පත්වූ විවිධ පාර්ශ්ව විරෝධතා සංවිධානය කර තිබුණු අතර 2021 අවසාන මාස හයේදී පමණක් පැවැත්වූ විරෝධතා සංඛ්‍යාව 400කට අධික වේ.

**2022 ජනවාරි පළමු වැනිදා සිට 2022 දෙසැම්බර් 31 දක්වා**

ශ්‍රී ලංකාවේ වඩාත් තීරණාත්මක කාලපරිච්ඡේදයක් වූ මෙම කාලයේදී පළමු මාස තුනේදී ලංකාවේ විවිධ ප්‍රදේශවල විරෝධතා පැවැත්වූ අතර ඒ අතුරෙන් තීරණාත්මක විරෝධතාවය වූයේ මාර්තු 31 වැනිදා නුගේගොඩ මිරිහානේ පිහිටි ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නිවස අසල පැවැත්වූ විරෝධතාවයි. එතැන් සිට ඇරැඹී නොනවතින විරෝධතා රැල්ලේ උච්ඡස්ථාය වූයේ ජූලි නව වැනිදා කොළඹදී පැවැත්වූ විරෝධතාවලින් පසු ජනාධිපතිවරයා පලවා හැර ජනාධිපති මන්දිරය ඇතුළු වැදගත් ස්ථාන අත්පත් කර ගැනීමයි. අවසානයේ ජනාධිපතිවරයාට රටින් පලා ගොස් ධුරයෙන් ඉවත් වීමට සිදුවිය.
2022 වසරේ දී පැවැති විරෝධතා විසිරුවා හැරීම සඳහා ආරක්ෂක අංශ විවිධ පියවර ගත්තේය. විරෝධතා අතරතුර මිය ගිය ගණන 10ක් පමණ වේ. විරෝධතා අතරතුර පහරකෑමට ලක්වූ ගණන 100 ඉක්මවයි. විරෝධතා නිසා අත්අඩංගුවට පත්වූ ගණන 5000කට ආසන්න වේ.
මෙම කාලයේ පැවැති බහුතරයක් උද්ඝෝෂණ විසිරුවා හැරීම සඳහා පොලිසිය පෙර නොවූ විරූ ලෙස කඳුළු ගෑස් භාවිත කිරීම විශේෂත්වයක් විය.

# තොරතුරු රැස් කිරීම

ශ්‍රී ලංකාවේ දස වසරක කාලය තුල කඳුළු ගෑස් භාවිතය ගැන තොරතුරු ක්‍රම කිහිපයක් ඔස්සේ රැස් කළෙමු. ඉන් ප්‍රධානතම ක්‍රමය වන්නේ තොරතුරු දැන ගැනීමේ පනත ආශ්‍රයෙන් තොරතුරු ලබා ගැනීමයි. දෙවැනි ක්‍රමය වන්නේ සම්මුඛ සාකච්ඡා මගින් තොරතුරු ලබා ගැනීමයි.

2022 මැයි මාසය වන විට ලංකාවේ විවිධ ප්‍රදේශවල දිනපතා උද්ඝෝෂණ පැවැත්වෙමින් තිබිණි. එම බොහෝ උද්ඝෝෂණ මර්දනය කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය කඳුළු ගෑස් භාවිත කළ අතර කඳුළු ගෑස් ප්‍රහාරවලට ලක්වූවන්ට විවිධ ආසාත්මිකතා ඇතිවන්නට විය. ඒ අනුව ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ රජය යටතේ විරෝධතා මර්දනය කිරීම සඳහා විෂ සහිත කඳුළු ගෑස් මිලදී ගෙන ඇති බවට සැකයක් මතු විය. එය තහවුරු කර ගැනීම සඳහා මූලිකව තොරතුරු පනත යටතේ තොරතුරු ඉල්ලීම් තුනක් යොමු කිරීමට තීරණය කළෙමු.

2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 25 (3) වගන්තියේ විශේෂ ප්‍රතිපාදනයක් සඳහන් කර තිබේ. එනම් තොරතුරු ඉල්ලීමක් පුරවැසියකුගේ ජීවිතයට හෝ පුද්ගලික නිදහසට අදාල නම් තොරතුරු නිලධාරියා පැය 48ක් ඇතුළත එම ඉල්ලීමට ප්‍රතිචාර දැක්විය යුතුය. අදාල කාල වකවානුවේ දිනපතා උද්ඝෝෂණ පැවැත්වීමත්, එම බොහෝ උද්ඝෝෂණවලට කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීමත්, එම ප්‍රහාරවලට ලක්වන්නන්ට ආසාත්මිකතා ඇතිවීමත් නිසා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 25 (3) ප්‍රතිපාදනය යටතේ මෙම තොරතුරු ලබා ගැනීම සඳහා අපි තොරතුරු ඉල්ලීම් යොමු කළෙමු.

ඒ අනුව 2022 මැයි 24 වැනි දා පොලිස් මූලස්ථානයේ තොරතුරු නිලධාරියාට, පොලිස් සැපයුම් කොට්ඨාසයේ තොරතුරු නිලධාරියාට සහ පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ තොරතුරු නිලධාරියාට තොරතුරු ඉල්ලීම් තුනක් යොමු කෙරිණි.

අප ඉල්ලා සිටි තොරතුරු පහත පරිදිවේ.

2022 ජනවාරි 1 වන දින සිට 2022 මැයි 24 දක්වා කාලය තුළ,

*1.1 ලංකාවට ගෙන්වා ඇති කඳුළු ගෑස් ප්‍රමාණය කොපමණද?*
*1.2 ලංකාවට අවස්ථා කීයකදී කඳුළු ගෑස් ගෙන්වා තිබේද?*
*1.3 එම එක් එක් අවස්ථාවේදී වියදම් වූ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන්ව කොපමණක් ද?*
*1.4 එලෙස කඳුළු ගෑස් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දුන් ලේඛන මොනවාද?*
*1.5 එලෙස කඳුළු ගෑස් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවූ ලේඛන වල සහතික පිටපත් ලබා දෙන්න.*
*1.6 එම සෑම අවස්ථාවකටම අදාළ තාක්ෂණික ඇගයුම් කමිටු වාර්තා වල සහතික පිටපත් ලබා දෙන්න.*
*1.7 එම සෑම අවස්ථාවකටම අදාළ ටෙන්ඩර් ප්‍රධානය කළ ලිපි වල සහතික පිටපත් ලබා දෙන්න.*

*පොලිස් මූලස්ථානයේ තොරතුරු නිලධාරියා සහ පොලිස් සැපයුම් කට්ඨාසයේ තොරතුරු නිලධාරියා පැය 48ක් ඇතුළත කිසිම ප්‍රතිචාරයක් දැක්වූයේ නැතත් පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ තොරතුරු නිලධාරී ලෙස කටයුතු කරන එහි අණ දෙන නිලධාරියා ප්‍රතිචාර දක්වමින් එම තොරතුරු තම ආයතනයේ නැති බවත්, එම තොරතුරු තිබිය යුත්තේ පොලිස් සැපයුම් කොට්ඨාසයේ බවත් සඳහන් කළේය.*

පොලිස් සැපයුම් කොට්ඨාසයෙන් සහ පොලිස් මූලස්ථානයෙන් පැය 48ක් තුළ කිසිම ප්‍රතිචාරයක් නොලද හෙයින් පොලිස්පතිවරයාට අභියාචනයක් කළෙමු. පොලිස්පතිවරයාගෙන් ද ප්‍රතිචාරයක් නොලද හෙයින් ජූනි මස 03 වැනිදා තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාවට අභියාචනා කළ අතර එම අභියාචනය ජූනි මස 27 වැනිදා විභාගයට ගන්නා බව ජූනි 12 වැනිදා කොමිසම දැනුම් දුන්නේය.

තොරතුරු කොමිසමට අභියාචනා කිරීමෙන් පසු පොලිස් සැපයුම් කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයා ලිපියක් එවමින් එම තොරතුරු මුදා හැරීම නීතිය බලාත්මක කිරීමට හෝ ජාතික ආරක්ෂාවට අදාල නිසා ලබා දිය නොහැකි බව කියමින් තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළේය.

2022 ජූනි මස 27 වැනිදා මෙම අභියාචනය කැඳවූ අවස්ථාවේ පොලිස්පතිවරයා හෝ ඔහු වෙනුවෙන් නියෝජිතයකු නොතීසිය අනුව පෙනී සිටියේ නැත. ඒ අනුව අභියාචනය ජූලි 18 වැනිදා තෙක් කල් තැබිණි. එලෙස කල් තැබීමෙන් පසු අවස්ථා ගණනාවකදී පොලිසිය කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම නිසා ජූලි 12 වැනිදා තොරතුරු දැන ගැනීමේ කොමිසමේ සභාපති විශ්‍රාමික විනිසුරු උපාලි අබේරත්න අමතමින් ලිපියක් යොමු කළ අතර මෙම තොරතුරු ඉල්ලීම පුරවැසියන්ගේ ජීවිතවලට සහ පෞද්ගලික නිදහසට ඍජුවම සම්බන්ධ හෙයින් ජූලි මස 13 වැනිදා හෝ ඊට ආසන්න දිනක කැඳවන ලෙස ඉල්ලා සිටියද එවකට පැවැති තත්ත්වය හා ඉන්ධන හිඟය හේතුවෙන් ජූලි 13, 14,15 දිනයන්හිදී අභියාචනා විභාග නොකිරීමට තීන්දු කර ඇති බවත්, ඉන් පසු කොමිෂන් සභාව වැඩ ආරම්භ කළ වහාම මෙම අභියාචනයට ප්‍රමුඛත්වය දී කැඳවන බවත් ජූලි 13 දැනුම් දුන්නේය.

මේ අතරතුර ජූලි 13 වැනිදා කඳුළු ගෑස් ප්‍රහාරයට ලක්වූ තරුණයකු මිය ගිය බවට ජනමාධ්‍ය වාර්තා කිරීමෙන් පසු ජූලි 14 වැනිදා දෙවැනි වරටත් උපාලි අබේරත්න මහතා අමතමින් ලිපියක් යවමින් මෙම අභියාචනය පසුදිනම විභාගයට ගන්නා ලෙස ඉල්ලා සිටිය ද එම අභියාචනයට ප්‍රමුඛත්වයක් නොලැබුණු අතර කලින් කල් තැබූ දිනය වන ජූලි 18 වැනිදා අභියාචනය විභාගයට ගැනිණි.

එම අභියාචනා විභාගයේ දී කොමිෂන් සභාව තීන්දු කළේ අපගේ තොරතුරු ඉල්ලීමේ ඇති අංක 1 සිට අංක 3 දක්වා තොරතුරු වහාම මුදා හැරිය යුතු බවයි. සෙසු තොරතුරු මුදා හැරීම ගැන තීන්දු කිරීම සඳහා කොමිෂන් සභාවට පමණක් ඉදිරිපත් කළ යුතු බව ද කොමිසම තීන්දු කළේය.

එහෙත් පසුව පොලිස් සැපයුම් කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයා ලිඛිතව දැනුම් දුන්නේ 2022 වසරේ දී කඳුළු ගෑස් මිලදී ගෙන නොමැති බවයි. පොලිස් සැපයුම් කොට්ඨාසයේ තොරතුරු නිලධාරියා පරස්පර තොරතුරු ලබාදීම නිසා තොරතුරු පනතේ 38 සහ 39 වගන්ති යටතේ විනය බලධාරියාට දැනුම්දීමට සහ නඩු පැවරීමට කොමිසමට හැකියාව ඇති බැවින් ඒ අනුව කටයුතු කරන ලෙස ඉල්ලමින් ජූලි 28 වැනිදා තොරතුරු කොමිසමට ලිපියක් යොමු කළ ද පරස්පර තොරතුරු ලබාදීම ගැන විමර්ශනයක් සිදුවූයේ නැත.

පොලිසිය මේ ආකාරයේ පිළිතුරක් ලබා දෙන බවට ලැබුණු ආරංචිය සහ තවත් තොරතුරු එකතු කර ගැනීමේ වැදගත්කම සලකා බලමින් එම අභියාචනා විභාගය යන අතරතුරේදීම තවත් තොරතුරු ඉල්ලීම් තුනක් පොලිස් මූලස්ථානය, පොලිස් සැපයුම් කොට්ඨාසය සහ පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය වෙත යොමු කරමින් තොරතුරු ඉල්ලා සිටියෙමු.

අප ඉල්ලා සිටි තොරතුරු පහත පරිදිවේ.

2010 ජනවාරි 1 වන දින සිට 2022 ජනවාරි 1 වන දක්වා කාලය තුළ,

*1) ලංකාවට ගෙන්වා ඇති කඳුළු ගෑස් ප්‍රමාණය කොපමණද?*
*2) ලංකාවට අවස්ථා කීයකදී කඳුළු ගෑස් ගෙන්වා තිබේද?*
*4) එම එක් එක් අවස්ථාවේදී වියදම් වූ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන්ව කොපමණක් ද?*
*5) එලෙස කඳුළු ගෑස් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දුන් ලේඛන මොනවාද? එලෙස කඳුළු ගෑස් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවූ ලේඛන වල සහතික පිටපත් ලබා දෙන්න.*
*6) එම සෑම අවස්ථාවකටම අදාළ තාක්ෂණික ඇගයුම් කමිටු වාර්තා වල සහතික පිටපත් ලබා දෙන්න.*
*7) එම සෑම අවස්ථාවකටම අදාළ ටෙන්ඩර් ප්‍රධානය කළ ලිපි වල සහතික පිටපත් ලබා දෙන්න.*
*8) මෙම තොරතුරු ඉල්ලීමට පාදක වන කාලසීමාවේදී කඳුළුගෑස් භාවිත කළ ප්‍රමාණය වාර්ෂිකව ලබා දෙන්න.*
*9) පසුගිය දිනවල කල් ඉකුත් වූ කඳුළු ගෑස් පොමණ ප්‍රවමාණයක් භාවිත කළේද?*
*10) එලෙස භාවිත කිරීමට හේතුව කුමක්ද?*
*11) කල් ඉකුත් වූ කඳුළු ගෑස් භාවිත කිරීමට අවසර ගත්තේ කාගෙන්ද? ඊට අදාල ලේඛණවල සහතික පිටපත් ලබා දෙන්න.*
*12) 2022 මාර්තු 31 සිට 2022 ජූලි 17 තෙක් කඳුළු ගෑස් ප්‍රහාර අවස්ථා කොපමණ ප්‍රමාණයකදී එල්ල කර තිබේද?*
*13) එලෙස එල්ල කළ අවස්ථාවලදී භාවිත කරන ලද කඳුළු ගෑස් ප්‍රමාණයන් මොනවාද? ඒ බව සඳහන්වන ලේඛනවල සහතික පිටපත් ලබා දෙන්න.*
*14) එම අවස්ථාවලදී භාවිත කළ කඳුළු ගෑස් කුමන වසරවල මිලදී ගත් කඳුළු ගෑස්ද? ඊට අදාල සියලු ලේඛනවල සහතික පිටපත් ලබා දෙන්න.*

මෙම තොරතුරතුරු ඉල්ලීම් තුනට අදාලව පැය 48ක් ඇතුළත කිසිම ප්‍රතිචාරයක් නොලැබුණි. ඒ අනුව පොලිස්පතිවරයාට අභියාචනා තුනක් යොමු කළෙමු. පොලිස්පතිවරයාට අභියාචනා යොමු කළ දිනයේදීම පොලිස් සැපයුම් කොට්ඨාසයේ තොරතුරු නිලධාරියා අපට ලිපියක් එවමින් අදාල තොරතුරු ඉල්ලීම උපදෙස් ලබා ගැනීම සඳහා පොලිස් නීති කොට්ඨාසයට යොමු කර ඇතැයි දැනුම් දුන්නේය. ඉන් පසු ජූලි 27 වැනිදා යළිත් ලිපියක් එවමින් දැනුම් දුන්නේ අපගේ තොරතුරු ඉල්ලීම පනතට අනුව නිසි ආකාරව කර නැති බවට නීති කොට්ඨාසය දැනුම් දුන් නිසා ඒ අනුව කටයුතු කිරීමට හැකියාවක් නැති බවයි.

පොලිස්පතිවරයාට අභියාචනය යොමු කළ පසු පොලිස් මූලස්ථානයේ තොරතුරු නිලධාරියා වන පරිපාලනය භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ මහතා ලිපියක් එවමින් තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කළේය. ඊට හේතු ලෙස ඔහු සඳහන් කළේ අපගේ තොරතුරු ඉල්ලීමේ සඳහන් අංක 08 සිට 14 යටතේ ඉල්ලා ඇති තොරතුරු හෙළිදරව් කිරීම මගින් රාජ්‍ය ආරක්ෂාවට හෝ භෞමික අඛණ්ඩතාවට අගතියක් විය හැකි බවයි. ශ්‍රී ලංකා පොලිසිය වසර පහකට වරක් පැරණි ලේඛන විනාශ කරන නිසා අංක 01 සිට අංක 07 දක්වා තොරතුරු ලබා දිය නොහැකි බව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා සඳහන් කළේය.

කලින් තොරතුරු ඉල්ලීම්වලට සහ මෙම තොරතුරු ඉල්ලීම්වලට අදාලව පරස්පර තොරතුරු ලබාදීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස තොරතුරු කොමිෂන් සභාවෙන් 2022 අගෝස්තු 30 වැනිදා ලිඛිත ඉල්ලීමක් කළ ද එවැනි පරීක්ෂණයක් පැවැත්වූයේ නැත. එම ඉල්ලීම මෙම වාර්තාවේ අවසානයේ ඇති ඇමුණුම් කොටසේ ඇත.

මේ සම්බන්ධයෙන් පැමිණිල්ල විමර්ශනය නොකළ ද අභියාචනා තුන සැප්තැම්බර් 01 විභාග කිරීම සඳහා දින ලබා දුන් අතර මෙය මහජන වැදගත්කමක් සහිත සිදුවීමක් නිසා මාධ්‍යවේදීන්ට කොමිසම තුලට පැමිණ වාර්තා කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස සමාජය හා සාමයික කේන්ද්‍රය කොමිෂන් සභාවෙන් ලිඛිත ඉල්ලීමක් කළ අතර සාමාන්‍ය අධිකරණයක කටයුතු වාර්තා කරන ආකාරයටම මෙම කොමිෂන් සභාවේ අභියාචනා ද වාර්තා කළ හැකි බව කොමිසම දැනුම් දුන්නේය. තොරතුරු කොමිසමේ අභියාචනා විභාගයක් වාර්තා කිරීම සඳහා මාධ්‍යවේදීන් පැමිණුනේ පළමු වරට වීම ද විශේෂත්වයකි.

සැප්තැම්බර් පළමු වැනිදා අභියාචනය කැඳවූ අවස්ථාවේදී තොරතුරු ඉල්ලීම්වල අංක 01 සිට 07 දක්වා තොරතුරු ලබාදීමට පොලිසිය එකඟතාවය පළ කළ අතර අනිකුත් තොරතුරු ලබාදීම හෝ නොදීම ගැන ස්ථාවරය ලිඛිතව දැනුම් දෙන ලෙස කොමිසම පොලිසියට දැනුම් දුන්නේය. එදින කොමිසමේ කාර්ය සටහන් ඇමුණුම් කොටසේ ඇත.

ඉන් අනතුරුව සැප්තැම්බර් අට දිනැතිව පොලිස් සැපයුම් කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයා ලිපියක් එවමින් තොරතුරු කොටසක් පමණක් ලබාදුන්නේය.
සැප්තැම්බර් 14 දින නැවත අභියාචනය විභාගයට ගත් අතර එහිදී දින 10ක් තුල තොරතුරු ලබා දිය හැකි බවට පොලිසිය සඳහන් කළ හෙයින් අභියාචනා විභාගය ඔක්තෝබර 06 වැනිදාට කල් තැබිණි. සැප්තැම්බර් 30 වැනිදා දිනැතිව පොලිස්පති සී ඩී වික්‍රමරත්න මහතා ලිඛිතව දැනුම් දුන්නේ ඉල්ලා ඇති තොරතුරුවලින් අංක 13 සහ 14 යන ඉල්ලීම්වලට අදාලව ජාතික ආරක්ෂාව හේතුවෙන් තොරතුරු ලබාදිය නොහැකි බවයි. ඔක්තෝබර 06 වැනිදා

මෙම අභියාචනා විභාගය අවසන් කළ අතර තීන්දුව ලබාදීම ඔක්තෝබර 27 තෙක් කල් තැබිණි. ඊට පෙර දෙපාර්ශ්වයටම ලිඛිත සැලකිරීම් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස කොමිසම දැනුම් දුන්නේය.

ඒ අනුව පොලිසියේ ක්‍රියාකාරිත්වය සහ සියලු තොරතුරු මුදා හැරීම සම්බන්ධයෙන් ඇමුණුම් 25ක් සමග දීර්ඝ ලිඛිත දේශනයක් ඔක්තෝබර 17 වැනිදා ඉදිරිපත් කළෙමු. ඔක්තෝබර 27 වැනිදා අභියාචනයේ තීන්දුව ලබා දෙමින් තොරතුරු කොමිෂන් සභාව තීන්දු කළේ මහජන වැදගත්කමක් සහිත මෙම තොරතුරු මුදා හැරිය යුතු බවයි.

ඒ අනුව පොලිස්පතිවරයාගේ අත්සනින් තොරතුරු ලැබුණ ද ඒවා සම්පූර්ණ තොරතුරු නොවේ. අසම්පූර්ණ, නොමග යවන සහ අසත්‍ය තොරතුරු ලබාදීම හේතුවෙන් පොලිසියේ අදාල නිලධාරීන්ට එරෙහිව නඩු පවරන ලෙස ඉල්ලමින් තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාවට ලිඛිත පැමිණිල්ලක් කර තිබේ.

ඉහත තොරතුරු ඉල්ලීම්වලට අදාලව හුවමාරුවූ වැදගත් ලිපි ලේඛන ඇමුණුම් කොටසේ ඇතුළත් කර තිබේ.

# කඳුළු ගෑස්

**කඳුළු ගෑස් යනු**

කඳුළු ගෑස් යනු කැරලි මර්දනය සඳහා යොදා ගන්නා ජනප්‍රිය මෙවලමක් ලෙස සරලව හැඳින්විය හැකිය. නමින් එය කඳුළු ගෑස් ලෙස හැඳින්වුව ද සැබවින්ම එය ගෑස් වර්ගයක් නොවේ. එය රසායන ද්‍රව්‍යවල එකතුවකි.

ලෝකයේ කඳුළු ගෑස් භාවිතා කළ ඉතිහාසය වසර 100කටත් එහා පැරණිය. විවිධ රටවල් විවිධ අවස්ථාවල කඳුළු ගෑස් සඳහා විවිධ අන්තර්ගතයන් භාවිත කර තිබේ. විශේෂයෙන් ගම්මිරිස් මිශ්‍රණ පවා යොදා ගත් බවට වාර්තා තිබේ.



කෙසේ වෙතත් වර්තමානයේ කැරලි මර්දනයට යොදා ගන්නා කඳුළු ගෑස්වල ප්‍රධාන වශයෙන් අන්තර්ගත වන්නේ සීඑස් නම් රසායනයයි. සීඑස් යනු වාෂ්පශීලී ද්‍රාවකයක් සහ කාමර උෂ්ණත්වයේ දී ඝන සංයෝග යක් වන 2-chlorobenzalmalononitrile වේ. එය ප්‍රථම වරට එසාාකැඉමරහ ඤකකැටැ හි ඇමරිකා ජාතිකයන් දෙදෙනෙකු වන Ben Corson iy Roger Stoughton විසින් 1928 දී සංස්ලේෂණය කරන ලද අතර, රසායනයේ නම සී එස් ලෙස නම් සකස් කර ඇත්තේ විද්‍යාඥයින්ගේ වාසග මේ මුල් අකුරු වලිනි.

කඳුළු ගෑස් සඳහා වැඩිපුරම යොදාගෙන ඇති සංයෝග පහත දැක්වේ.
Oleoresin capsicum (OC)
Chlorobenzylidene malononitrile (CS&)
Dibenzoxazepine (CR)
මීට පෙර සඳහන් කළ පරිදි මේ වන විට කඳුළු ගෑස් උණ්ඩ හෝ බෝම්බ සඳහා වැඩි වශයෙන් ලෝකයේ භාවිත කරන්නේ සීඑස් නම් රසායන සංයෝගය වේ.

## කඳුළු ගෑස්වල බලපෑම

කඳුළු ගෑස් ප්‍රහාරවලට ලක්වීම නිසා ඇති විය හැකි තත්ත්වයන් කොටස් කිහිපයකට බෙදා දැක්විය හැකිය. ඒ කෙටි කාලීන තත්ත්වයන්, දීර්ඝ කාලීන තත්ත්වයන් සහ මාරාන්තික තත්ත්වයන් ලෙසය. අතීතයේ දී කඳුළු ගෑස්වලින් ඇතිවිය හැකි කෙටි කාලීන තත්ත්වයන් ගැන කතා බහ කළ ද වර්තමානයේ ලෝකයේ වැඩිපුරම කතා බහට ලක් වන්නේ කඳුළු ගෑස් නිසා ඇතිවිය හැකි දීර්ඝ කාලීන තත්ත්වයන් ගැනයි. මේ සම්බන්ධයෙන් පර්යේෂණ ගණනවක් සිදු කර ඇති අතර ඒවා සම්බන්ධයෙන් ඉදිරි පරිච්ඡේදවලදී වැඩිපුර තොරතුරු ඉදිරිපත් කරන හෙයින් මෙම අවස්ථාවේදී කෙටියෙන් කරුණු පමණක් සඳහන් කරමු. කඳුළු ගෑස් නිසා බහුලවම ඇතිවන බවට පෙනෙන තත්ත්වයන් පහත දැක්වේ.

- ඇස් දැවිල්ල
- සමේ ඇතිවන දැවිල්ල
- හුස්ම ගැනීමේ අපහසුතාවය
- ක්ලාන්තය
- වමනය

ඊට අමතරව පපුවේ අමාරුව වැනි තත්ත්වයන් සහ ශ්වසනාබාධ ඇතිවීම නිසා මරණය පවා අත්විය හැකි බව ඇතැම් පර්යේෂකයන් පෙන්වා දී තිබේ. දිගුකාලීනව නිරාවරණය වීම හෝ විශාල මාත්‍රාවකට නිරාවරණය වීම වඩාත් දරුණු තුවාල හා මරණයට පවා ඇතිවීමට හේතු විය හැකිය.

කඳුළු ගෑස්වල විවිධ බලපෑම් පිළිබඳව වැඩිදුර පර්යේෂණ අවශ්‍ය වේ. නමුත් අධ්‍යයනවලින් පෙනී යන්නේ ළමුන්, වැඩිහිටියන්, ආබාධ සහිත පුද්ගලයින් සහ නිදන්ගත සෞඛ්‍ය තත්වයන් ඇති අය බරපතල තත්ත්වවලට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇති බවයි.

කඳුළු ගෑස් උණ්ඩ උද්ඝෝෂකයන් දෙසට කෙලින් එල්ල කිරීම නිසා ඒවා වැදී මරණය හෝ බරපතල තුවාල පවා ඇතිවිය හැකිය.

කඳුළු ගෑස්වලට නිරාවරණය වීමෙන් ඇතිවන ප්‍රතිවිපාක ගැන පසු පරිච්ඡේදවල සවිස්තරාත්මකව සඳහන් කරනු ඇති අතර මේ සියලු කාරනා සඳහන් ලේඛන ඇමුණුම් කොටසේ ඇතුළත් කර තිබේ.

## ශ්‍රී ලංකාවේ කඳුළු ගෑස් භාවිතය

පසුගිය වසර 10ක කාලය ගත්විට ශ්‍රී ලංකාවේ උද්ඝෝෂණ / විරෝධතා විසිරුවා හැරීම සඳහා කඳුළු ගෑස් භාවිත කළ අවස්ථා කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.



1) ප්‍රචණ්ඩකාරී හෝ කළහකාරී උද්ඝෝෂණ/විරෝධතා විසිරුවා හැරීම

ශ්‍රී ලංකාවේ මෙවැනි උද්ඝෝෂණවලට කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කළ අවස්ථා ඇත්තේ ඉතාම අඩු ගණනකි. පොලොන්නරුව මන්ත්‍රීවරයකුගේ නිවසට හානි සිදු කරන අවස්ථාවේදී කඳුළු ගෑස් ප්‍රහාරයක් එල්ල කිරීම ඊට එක් උදාහරණයකි.



2) සාමකාමී උද්ඝෝෂණ/ විරෝධතා විසිරුවා හැරීම සඳහා පසුගිය වසර 12ක කාලයේදී පොලිසිය වැඩිපුරම කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කර ඇත්තේ සාමකාමී විරෝධතාවලට වීම විශේෂත්වයකි. 2022 වසරේ දී එය කැපී පෙනන ලක්ෂණයක් විය.

සාමකාමී උද්ඝෝෂණ/විරෝධතා විසිරුවා හැරීමට කඳුළු ගෑස් එල්ල කරන ආකාරය අනුව තවදුරටත් කොටස් කිහිපයකට දැක්විය හැකිය.

1) උද්ඝෝෂකයන් ඉලක්ක කර ගනිමින් කෙලින් කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම.

මෙවැනි අවස්ථා රැසක් පසුගිය කාලයේ වාර්තා විය. එලෙස එල්ල කරන ලද කඳුළු ගෑස් උණ්ඩයක් වැදී සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වන රතිඳු සේනාරත්න හෙවත් රැට්ටාගේ පාදයකට තුවාල සිදුවීම ඊට උදාහරණයකි.

2) සම්පූර්ණයෙන් විවෘත නොවූ අවකාශයන්වලදී කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම.

උස ගොඩනැගිලිවලින් වටවූ ස්ථානවල දී කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කළ අවස්ථා කිහිපයක් තිබෙන අතර 2022 ජූලි මස 8 වැනිදා අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ විරෝධතාවය ඉලක්ක කර ගනිමින් එල්ල කළ කඳුළු ගෑස් ප්‍රහාරය ඊට උදාහරණයකි. වැලිකඩ බන්ධනාගාරය තුලට කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම ද එක් උදාහරණයකි.

3) එක් උද්ඝෝෂණයක් සඳහා කඳුළු ගෑස් උණ්ඩ හෝ බෝම්බ විශාල සංඛ්‍යාවක් එල්ල කිරීම.

මෙය වැඩි වශයෙන්ම නිරීක්ෂණය වූයේ 2022 වසරේදීය. 2022 වසරේදී පැවැති බොහෝ උද්ඝෝෂණවලට කඳුළු ගෑස් උණ්ඩ හෝ බෝම්බ සිය ගණනක් එල්ල කර තිබිණි. ඊට උදාහරණයක් ලෙස ජූලි මස නව වැනිදා බාරොන් ජයතිලක මාවතේ විරෝධතාවයට එල්ල කළ කඳුළු ගෑස් ප්‍රමාණය දැක්විය හැකිය. එම ගණන කඳුළු ගෑස් උණ්ඩ සහ බෝම්බ 817කි.

4) අවධානමකට ලක් විය හැකි පිරිස් සිටින උද්ඝෝෂණවලට කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම.

ආබාධිත පුද්ගලයන්, හදවත් රෝගීන් වැඩි පිරිස් සිටින විරෝධතාවලට කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම ද පසුගිය කාලයේදී දිගින් දිගටම සිදු විය. 2017 නොවැම්බර් 07 වැනිදා ආබාධිත හමුදා සාමාජිකයන් පිරිසකගේ විරෝධතාවකට කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම ඊට උදාහරණයකි.

5) විරෝධතාකරුවන් සිටින ස්ථානය පලායාමට නොහැකි ලෙස වට කර කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම.

විරෝධතාකරුවන් එක් ස්ථානයකට කොටු කර ඔවුන්ට පලා යාමට ඇති සෑම මාර්ගයක්ම අවහිර කර කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම අවස්ථා කිහිපයකදී 2022 දී දැකගත හැකි විය.

2022 වසරේදී පමණක් නොව ඊට පෙර ද එලෙස කටයුතු කළ අවස්ථා තිබේ. 2017 දී අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ විරෝධතාවයක් විහාරමහා දේවී උද්‍යානයට තුලට කොටු කර සෑම දෙසකින්ම කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කරනු දක්නට ලැබිණි.

6) පලා යන විරෝධතාකරුවන් දෙසට කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම.

විරෝධතාවයකට සහභාගී වී පොලිසිය ජල හෝ කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම නිසා පලායන විරෝධතාකරුවන් සිටින දෙසට කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම ද නිරන්තරයෙන් දක්නට ලැබේ.

7) කල් ඉකුත් වූ කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම

ශ්‍රී ලංකාවේ කල් යකුත් වූ කඳුළු ගෑස් 2022 වසරට පෙර සිටම එල්ල කළ බවට වාර්තා වුවද එය සනාථ කරන සාක්ෂි ලැබී ඇත්තේ 2022 වසරට අදාලව පමණි. 2022 මැයි නව වැනිදා තංගල්ලේ විරෝධතාකරුවන් විසිරුවා හැරීමට එල්ල කර ඇත්තේ 2010 වසරේ දී නිශ්පාදනය කරන ලද කඳුළු ගෑස් වීම මීට උදාහරණයකි.

# කඳුළු ගෑස් මිලදී ගැනීම




SRI LANKA
POLICE DEPARTMENT

BID FOR THE SUPPLY OF
5000 Nos. CS Shells

LA/S1/FFHQ/01/2016

ශ්‍රී ලංකාවේ 2012 වසරේ සිට 2022 වසර දක්වා කාලය තුලදී අවස්ථා හතරකදී ශ්‍රී ලංකා පොලිසිය සඳහා කඳුළු ගෑස් මිලදී ගෙන ඇති බව ලේඛනවල සඳහන්ව තිබේ. එම අවස්ථාවලදී මිලදී ගත් කඳුළු ගෑස් ප්‍රමාණය ගැන තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | මිලදී ගත් ප්‍රමාණය |
|---|---|
| 2012 | 20,000 |
| 2017 | 5000 |
| 2019 | 15,000 |
| 2020 | 5000 |



File No. LA/S1/FFHQ/01/2016

සටහන් පත්‍රය
NOTE SHEET
පොලිස්පති කාර්යාලය
OFFICE OF THE INSPECTOR - GENERAL OF POLICE
සටහන් පත්‍රය මෙම කාර්යාලයෙන් බැහැර නොයා යුතුය
NOT TO LEAVE THIS OFFICE

2016.12.15

ශ්‍රී ලංකා පොලිසියට කඳුළු වායු පතොරම් (CS Shells ) 5,000 ක් මිලදී ගැනීම සඳහා තීරණයක් ගැනීම සඳහා.

LA/S1/FFHQ/01/2016

01. 2016 වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලසුමට අනුව ශ්‍රී ලංකා පොලිසියේ කැරලි මර්ධන රාජකාරි සඳහා කඳුළු වායු පතොරම් (CS Shells )5,000 ක් මිලදී ගැනීම මෙම ගොනුව යටතේ ලංසු කැඳවා ඇත.

02. මේ සඳහා 2015.08.27 වන දින පැවති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් රු.22,000,000.00 ක දළ ඇස්තමේන්තු මුදලක් ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ මිලදී ගැනීමට අනුමැතිය ලබාදී ඇත. (සටහන් පත්‍ර අංක i-ii)

03. ඒ අනුව 2015.12.22 වන දින දිනමිණ, තිනකරන්, සහ ඩේලි නිවුස් යන පුවත්පත්වල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් දැන්වීම් පළ කර මේ සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීම (NCB) යටතේ ලංසු කැඳවා ඇත. (පිටු අංක 10 - 14)

04. මෙම ලංසු 2016.02.29 දින පැය 1400 ට විවෘත කරන ලදී. (පිටු අංක 168)

05. ලංසු විවෘත කිරීමේ මණ්ඩලය සඳහා පහත සඳහන් නිලධාරීන් සහභාගී විය. (පිටු අංක 168)

## 2012 වසරේ මිලදී ගැනීම


2012 වසරේ දී කඳුළු ගෑස් මිලදී ගැනීම ගැනීමට අදාල බොහෝ තොරතුරු ශ්‍රී ලංකා පොලිසිය තොරතුරු පනත අනුව මෙතෙක් මුදා හැර නැත. දැනට ලැබී ඇති තොරතුරු විග්‍රහ කිරීමේදී අනාවරණය කර ගත හැකි වන්නේ 2012 වසරේ දී කඳුළු ගෑස් 20,000ක් මිලදී ගෙන ඇති බවයි. ඒ උණ්ඩ 10,000ක් සහ බෝම්බ 10,000ක් වශයෙනි.

එම මිලදී ගැනීම සිදු කර ඇත්තේ 2012 වසරේ ජූලි මස 07 වැනිදා වන අතර චීන රජය සමඟ ඇති කරගෙන තිබූ යුද අවි ගිවිසුම යටතේ නොරිකෝ සමාගමෙන් එම කඳුළු ගෑස් උණ්ඩ සහ බෝම්බ මිලදී ගෙන තිබේ. පොලිසිය නිල වශයෙන් සඳහන් කරන්නේ මෙම මිලදී ගැනීමට අදාල ලේඛන පොලිස් සැපයුම් කොට්ඨාසය සතුව නොමැති බවයි. මෙම තොගය මිලදී ගැනීමේදී සාම්පල පරීක්ෂා කිරීමක් සිදුවූවාද නැද්ද යන්න පවා ලේඛණ නොමැති නිසා තහවුරු කර ගැනීමේ හැකියාවක් නැත.

මෙම තොගය සඳහා වැයවී ඇති මුදල එවකට සඳහන් වූයේ රුපියල් 61,080,000ක් ලෙසය.

**2017 වසරේ මිලදී ගැනීම**

කඳුළු ගෑස් පතොරොම් 5000ක් මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත්තේ 2015 වසරේ දී ය. එම වසරේ දෙසැම්බර් 22 වැනිදා දිනමිණ, තිනකරන් සහ ඩේලි නිව්ස් පුවත්පත්වල කඳුළු ගෑස් මිලදී ගැනීම්වලට අදාල දැන්වීම් පළ කර ඇති අතර 2016 පෙබරවාරි මස 29 වැනිදා පස්වරු 2.00ට සහකාර පොලිස් අධිකාරී රොහාන් ප්‍රනාන්දු, ගණකාධිකාරී එම් ජී කේ එස් දමයන්ති මහත්මිය, රවීන් හේවාපිටිගල සහ ඊ ඒ එන් හර්ෂණී මහත්මිය ඉදිරියේ ලංසු විවෘත කර තිබේ.



01/36

අධ්‍යක්ෂ- සැපයුම්
Director/Supplies
Telephone No : 011-2399141
Fax : 011-2320729
Extension : 3015
E-Mail : dr.supplies@police.lk
සහකාර පොලිස් අධිකාරී- සැපයුම්
ASP/Supplies
Tele/Fax : 011-2324915
Extension : 3114
ස්ථානාධිපති- සැපයුම්
OIC/Supplies
Tele/Fax : 011-2543012
Extension : 3111

පොලිස් සැපයුම් කොට්ඨාශය
பொலிஸ் விநியோகப் பிரிவு
POLICE SUPPLIES DIVISION

පොලිස් මූලස්ථානය, දෙවන මහල, කොළඹ 01, ශ්‍රී ලංකා.
பொலிஸ் தலைமை அலுவலகம், 2 டாம் மாடி கொழும்பு 01, இலங்கை.
POLICE HEADQUARTERS, 2nd FLOOR, COLOMBO 01, SRI LANKA.

My No : 1 D/ සැප/ කෘ/ 920/ 2019

Accountant/Supplies
Chief Management Asst:
General No : 011-2421111

18 APR 2019

2019.03.22

ORIGINAL

ACE ඉන්ටර්නැෂනල්.
අංක A/G/3/1
ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

ACE INTERNATIONAL
A/G/3/1 Sri Sangaraja Mawatha
Colombo 10

**ශ්‍රී ලංකා පොලිසිය වෙත CS SHELLS 15000 ක් මිලදී ගැනීම. (LA/S1/FFHQ/02/2019)**

උක්ත ප්‍රසම්පාදනය සඳහා ඔබ ආයතනය විසින් ලංසුපත් ලබාගෙන ඇති අතර, මෙම ප්‍රසම්පාදනයට අදාල ලංසු විවෘත කිරීම 2019.02.18 වන දින සිදු කිරීමට නියමිතව තිබූ නමුත්, ලංසුපත් ලබාගත් ආයතන විසින් කර ඇති ඉල්ලීම් පිළිබද සලකා බලා එහි ලංසු විවෘත කිරීම 2019.03.05 වන දින දක්වා දීර්ඝ කරන ලදී.

තවද ලංසුපත් ලබාගත් ආයතන 02ක් විසින් ලිඛිතව කරන ලද ඉල්ලීම් පිළිබද සලකා බැලීමෙන් පසු 2019.03.05 වන දින ලංසු විවෘත කිරීම සිදු නොකර එදින පැය 10.00 ට පූර්ව ලංසුකරුවන් දැනුවත් කිරීමේ සාකච්ඡාවක් (Pre Bid Meeting) පැවැත්වීමට කටයුතු කරන ලදී.

මෙම සාකච්චාව පොලිස් මූලස්ථාන සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වූ අතර, එහිදී ඇති කරගන්නා ලද එකගතාවය සැලකිල්ලට ගෙන මෙම ප්‍රසම්පාදනයන්ට අදාල ලංසු විවෘත කිරීම 2019.04.18 වන දින දක්වා දීර්ඝ කිරීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර ඇත.

ඒ අනුව ලංසු විවෘත කිරීම 2019.04.18 වන දින ප.ව 02.00 ට සිදු කරනු ලබන අතර, ආදර්ශ භාණ්ඩ එදින ප.ව 01.00 ට පෙර ලබා දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ආදර්ශ භාණ්ඩ භාර ගනු නොලැබේ. ලංසු වලංගු කාලය හා ලංසු බැදුම්කර වලංගු කාලය පහත සදහන් පරිදි සංශෝධනය විය යුතුය.

| | | |
|---|---|---|
| ලංසු වලංගු කාලය (ITB 19.1) | 2019.07.17 | 16 පැවුව |
| ලංසු බැදුම්කරය වලංගු කාලය (ITB 20.2) | 2019.08.14 | 16 පැවුව |

අධ්‍යක්ෂ,
සැපයුම් කොට්ඨාශය.

අධ්‍යක්ෂ
සැපයුම් කොට්ඨාශය
පොලිස් මූලස්ථානය
කොළඹ 01

පිටපත ගොනුවට.

Fonny's Private Limited iy Securatec Lanka (Pvt) Ltd පමණක් ලංසු ඉදිරිපත් කර ඇතැයි ලේඛනවල සඳහන් වේ.

මෙම ලංසු ඇගයීම සඳහා පොලිස්පතිවරයා විසින් නියෝජ්‍ය පොලිස්පති පී එස් වල්ගම, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ප්‍රියලාල් දසානායක සහ ගණකාධිකාරී බී එල් ඩී පී ඩෙලිකා යන මහත්ම මහත්මීගෙන් සමන්විත තාක්ෂණික කමිටුවක් පත් කර ඇත. තාක්ෂණික කමිටුව මුල් වරට 2022 සැප්තැම්බර් මස 28 වැනිදා රැස්වී ඇති අතර ඔවුන්ගේ නිර්දේශය වී ඇත්තේ කඳුළු ගෑස් උණ්ඩ 5000 මිලදී ගැනීම සඳහා වන fgkavrh Securatec Lanka (Pvt) බළු ප්‍රධානය කිරීමටයි. එහි විදේශීය සමාගම ලෙස සඳහන් වන්නේ Korea CNO Tech Co, ltd නම් ආයතනයකි.
මෙම මිලදී ගැනීම සඳහා ගිය වියදම එවකට රුපියල් 10,809,814කි.

**2019 මිලදී ගැනීම**

ශ්‍රී ලංකා පොලිසියට කඳුළු ගෑස් උණ්ඩ 15,000ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවද්දී Securatec Lanka (Pvt) Ltd යන ආයතනයට සහ ACE International යන ආයතනය

ලංසු ඉදිරිපත් කර ඇති අතර නියෝජ්‍ය පොලිස්පති ජේ ඒ පී පී පෙරේරා, සහකාර පොලිස් අධිකාරී ඒ ආර් ඩබ්ලිව් එම් ජේ පෝද්දල්ගොඩ සහ ගණකාධිකාරී ඩී එන් ඩී පෙරේරා යන මහත්ම මහත්මීහු තාක්ෂණික ඇගයීම සිදු කළහ.

තාක්ෂණික කමිටුවේ නිර්දේශය වූයේ 'කෑ ෂබඑැරබ්එසදබ්ක සමාගමෙන් මෙම තොගය මිලදී ගැනීමටය. එහි විදේශීය ආයතනය ලෙස සඳහන් වූයේ ක-ඍසජය ඨකදඅ්ක බ්;ැර නම් ආයතනයකි.


මෙම තොගය මිලදී ගැනීම සඳහා වැයවී තිබූ මුදල රුපියල් 39,399,006 කි.

**2020 මිලදී ගැනීම**

ශ්‍රී ලංකා පොලිසියට කඳුළු ගෑස් බෝම්බ 5000ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීමේ කටයුතු ආරම්භ වී තිබුණේ 2018 වසරේදී ය. නියෝජ්‍ය පොලිස්පති එල් කේ ඩබ්ලිව් කේ සිල්වා, සහකාර පොලිස් අධිකාරී ඩී එල් ලීලාරත්න, සහකාර ලේකම් ඩබ්ලිව් ඒ ඩී ඒ කාන්චන, ගණකාධිකාරී ඩී එම් ඒ වික්‍රමරත්න යන තාක්ෂණික ඇගයුම් කමිටු සාමාජිකයන් විසින් මෙම ලංසුව පිරිනැමීම සඳහා අනුමැතිය ලබා දී ඇත්තේ ACE International සමාගමින් මිලදී ගැනීම සඳහාය. එහි විදේශීය ආයතනය ලෙස සඳහන් වූයේ Navigation Marketing pte ltd නම් ආයතනයකි.

මෙම තොගය මිලදී ගැනීම සඳහා ගොස් ඇති වියදම රුපියල් 50,812,310කි.

## කඳුළු ගෑස්වල අන්තර්ගතය


CS HAND GRENADE (3pieces) N500


- MODEL : CS GRENADE (3 PIECES)
- DIAMETER : 55MM ± 2MM
- HEIGHT : 145MM ± 5MM
- WEIGHT : 300G ± 20G
- TOTAL CHEMICAL AMOUNT : 105 ± 5G
- DELAY TIME : 1.5 ~ 2 SEC
- BURNING TIME : 30 ± 10 SEC
- DISCHARGE RANGE : 80 MTR
- HAND THROWN RANGE : 30 MTR
- SELF LIFE : 5 YEARS

ශ්‍රී ලංකා පොලිසිය 2012 වසරේ දී මිලදී ගත් කඳුළු ගෑස්වල අන්තර්ගතය ගැන කිසිම තොරතුරක් පොලිස් සැපයුම් කොට්ඨාසය සතුව නැති බව නිල වශයෙන් වාර්තා කර ඇත.

2017 වසරේ දී මිලදී ගත් කඳුළු ගෑස් උණ්ඩයක බර ග්‍රෑම් 185ක් වන අතර කඳුළු වායුව පැතිරෙන දුර ප්‍රමාණය මීටර 150කි. එය නිශ්පාදනය කර ඇත්තේ 2016 වසරේදී ය. සීඑස් අන්තර්ගතය ග්‍රෑම් 25කි. ආයුකාලය වසර 5ක් ලෙස එම සමාගම ලිඛිතව දැනුම් දි තිබේ.

2019 වසරේ දී මිලදී ගත් කඳුළු ගෑස් උණ්ඩයක බර ග්‍රෑම් 180 වන අතර කඳුළු වායුව පැතිරෙන දුර ප්‍රමාණය මීටර 50 සිට 100 දක්වා වේ. සීඑස් අන්තර්ගතය ග්‍රෑම් 25ක් වන අතර ආයු කාලය වසර පහකි.

2020 වසරේ දී මිලදී ගත් කඳුළු ගෑස් බෝම්බයක බර ග්‍රෑම් 300ක් පමණ වන අතර කඳුළු වායුව මීටර 80ක් පමණ දුරට පැතිරෙයි. මෙහි විශේෂත්වය වන්නේ අන්තර්ගත රසායන ද්‍රව්‍ය ප්‍රමාණය ග්‍රෑම් 105ක් ලෙස සඳහන් වීමය.


TECHNICAL SPECIFICATIONS

CS SHELLS - ANTI RIOT

(The Technical specifications may be provided in the following format. The bidder shall the columns 6 & 7. Bidder's failure to provide the information requested in the columns 6 & 7 may be a reason for the rejection of the bid. If discrepancy is observed between the information by the bidder in columns 6 & 7 and the other technical information attached to the bid, the information provided herein shall take precedence)

| (1) Line Item No. | (2) Description of goods or related services | (3) Sub Component | (4) Purchaser's Requirement Detail | (5) Priority | (6) Bidder's Offer Yes (Y) No (N) | (7) Remarks |
|---|---|---|---|---|---|---|
| 01 | CS Shells Anti Riot | 1. Body of Shell | Light metal fitted with percussion cap &delay fuse. | | Y | Complies |
| | | 2. Caliber | 37-38 mm | | Y | Complies |
| | | 3. Length | 122 mm | | Y | 122mm ± 2mm |
| | | 4. Diameter | Base with rim 39.6 mm | | Y | 40.0mm - 43.0mm |
| | | 5. Weight | 210g. ± 5 g. | | Y | 180g - 210g |
| | | 6. CS Contents | 25g. ± 3 g. | | Y | 25g ± 1g |
| | | 7. Ignition Delay Time | Percussion cap 2-3 seconds | | Y | Complies |
| | | 8. Burning time | 10 - 15 seconds | | Y | 10 - 20S |
| | | 9. Range | 150 meters & over | | Y | Complies |
| | | 10. Life Time | More than 5 years | | Y | Complies |
| | | 11. Is it current production | To be current production | | Y | Complies |

L.H.G. Cooray
Senior Superintendent of Police
Commandant
Field Force Headquarters
Colombo 05.

Name of Bidder : M/s Securatec Lanka (Pvt) Ltd
(Insert complete name of bidder)
Signature of Bidder :
(Signature of person signing the bid)
Date: 29/02/201[illegible]
(Insert Date)

CS Shells falls under Explosive Items under Dangerous Cargo and Cannot be air freighted. We have attached a video of the product and also offer 02 officials from Sri Lanka Police to visit [illegible] for Factory Acceptance prior to delivery of goods. This offer is provided free of Charge.

i

## සාම්පල් පරීක්ෂාව

2016, 2019 සහ 2020 යන වසරවලට අදාලව කඳුළු ගෑස් මිලදී ගැනීමේ දී සාම්පල පරීක්ෂාවක් සිදු කර නැත. මෙය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උල්ලංඝනය කිරීමකි.

මෙම කඳුළු ගෑස් උණ්ඩ සහ බෝම්බවල සීඑස් පවුඩර් සහ පොටෑසියම් ක්ලෝරේඩ් අඩංගු බව ලේඛනවල සඳහන් වෙයි. සැපයුම්කරුවන් විසින් ලබා දී ඇති එම තොරතුරු සත්‍ය බව පිළිගෙන ශ්‍රී ලංකා පොලිසිය කඳුළු ගෑස් මිලදී ගෙන තිබෙන අතර අඩු තරමේ එම රසායන ද්‍රව්‍ය කුමණ ප්‍රමාණයන්වලින් තිබේද යන්න තහවුරු කර ගැනීමටවත් සාම්පලවල අන්තර්ගතය පරීක්ෂා කිරීමක් සිදු කර නැත.

කඳුළු ගෑස් උණ්ඩය වැඩ කරනවාද යන්න පමණක් කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ දී පරීක්ෂා කර බලා තිබේ.

අදාල තාක්ෂණික ඇගයුම් කමිටුවල පවා කඳුළු ගෑස්වල අන්තර්ගතය ගැන ප්‍රවීණයකු කටයුතු කර නැත.

ඒ අනුව ශ්‍රී ලංකාවේ භාවිත කරන කඳුළු ගෑස් මනුෂ්‍ය ශරීරයට විෂ ද නැද්ද යන්නවත් තහවුරු කර ගැනීමට උත්සාහයක් ගෙන නැත.

> සැපයුම් කොට්ඨාශය මගින් අවසන් වරට මිලදී ගෙන ඇති කඳුළු වායු උණ්ඩ සහ බෝම්බවල Potassium Chlorate සහ CS Powder අඩංගු බව සැපයුම්කරු විසින් සපයා ඇති තොරතුරු වල සඳහන්ව ඇතත්, එම රසායනික ද්‍රව්‍යවල අඩංගු ප්‍රතිශතයන් සඳහන් කර නොමැත. මෙම භාණ්ඩ ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව නිෂ්පාදනය කර ඇති අතර, මේ සම්බන්ධව විමසීමේදී නිෂ්පාදන තොරතුරු වෙනත් අයෙකු වෙත යාමට ඉඩ ඇති බැවින් එම ප්‍රතිශතයන් සඳහන් නොකරන බව පවසන ලදී. (මේ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා රසායනාගාර පරීක්ෂණයක් ද සිදුකර නොමැත.)

## 2012 සිට 2022 දක්වා කඳුළු ගෑස් එල්ල කිරීම

2012 වසරේ සිට 2022 ජනවාරි පළමු වැනිදා තෙක් කාලයේදී ශ්‍රී ලංකා පොලිසිය වැඩිම කඳුළු ගෑස් ප්‍රමාණයක් භාවිත කර ඇත්තේ 2017 වසරේදී ය. ඒ පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය විසිනි. මෙම වසරේ දී අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය හෝ විශ්ව විද්‍යාල සිසුන් සංවිධානය කළ උද්ඝෝෂණ රැසක් තිබුණු අතර ඒවායෙන් බොහෝ ගණනකට කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කෙරිණි. 2017 වසරේ දී පොලිසිය එල්ල කළ මුළු කඳුළු ගෑස් උණ්ඩ සහ බෝම්බ ප්‍රමාණය 2327කි.

2012 සිට 2022 දක්වා කඳුළු ගෑස් එල්ල කිරීමට අදාල තොරතුරු පහත වගුවේ ඇත.

2012 සිට 2022 දක්වා කඳුළු ගෑස් එල්ල කිරීම්

**2012 සිට 2022 දක්වා කඳුළු ගෑස් එල්ල කිරීම්**

| කොට්ඨාසය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| Colombo South | 0 | 0 | 20 | 36 | 0 | 6 | 8 | 0 | 0 | 0 |
| Gampaha | 0 | 0 | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Police Field force HQ | 288 | 197 | 633 | 22 | 461 | 2327 | 758 | 786 | 0 | 0 |
| Mount Lavinia | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 0 |
| Colombo Central | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Nugegoda | 0 | 0 | 4 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Negambo | 0 | 0 | 3 | 0 | 42 | 8 | 0 | 0 | 0 | 0 |
| Batticoloa | 0 | 41 | 0 | 0 | 0 | 5 | 9 | 2 | 0 | 0 |
| Kandy | 0 | 0 | 0 | 0 | 0 | 0 | 3 | 0 | 0 | 0 |
| Anuradhapura | 20 | 0 | 0 | 0 | 0 | 0 | 31 | 0 | 98 | 0 |
| Kegalle | 0 | 0 | 0 | 0 | 0 | 0 | 6 | 0 | 0 | 0 |
| Bandarawela | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Peliyagoda | 0 | 0 | 33 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Ampara | 0 | 0 | 0 | 0 | 0 | 0 | 7 | 0 | 0 | 0 |
| Badulla | 16 | 4 | 0 | 0 | 0 | 0 | 0 | 15 | 0 | 0 |
| Mannar | 59 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Elpitiya | 43 | 0 | 20 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Ratnapura | 0 | 88 | 0 | 9 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Jaffna | 0 | 0 | 0 | 172 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Chilav | 89 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Matale | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| PSD | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| STF | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| PMSD | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Matara | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Polonnaruwa | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Tangalle | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| Public peace management division | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | **518** | **330** | **716** | **239** | **503** | **2346** | **822** | **805** | **98** | **0** |

| 2022 මාර්තු 31 සිට 2022 ජුලි 20 දක්වා කඳුළු ගෑස් එල්ල කිරීම් | |
|---|---|
| Division | |
| Colombo South | 133 |
| Gampaha | 6 |
| Police Field force HQ | 269 |
| Mount Lavinia | 36 |
| Colombo Central | 211 |
| Nugegoda | 88 |
| Negambo | 80 |
| Batticoloa | 58 |
| Kandy | 116 |
| Anuradhapura | 64 |
| Kegalle | 153 |
| Bandarawela | 0 |
| Peliyagoda | 0 |
| Ampara | 0 |
| Badulla | 0 |
| Mannar | 0 |
| Elpitiya | 0 |
| Ratnapura | 0 |
| Jaffna | 0 |
| Chilav | 0 |
| Matale | 0 |
| PSD | 15 |
| STF | 155 |
| PMSD | 321 |
| Matara | 61 |
| Polonnaruwa | 81 |
| Tangalle | 41 |
| Public peace management division | 4834 |
| | 6722 |

## අධික ප්‍රමාණවලින් උද්ඝෝෂණවලට කඳුළු ගෑස් එල්ල කිරීම

මීට පෙර නොවූ විරූ ලෙස 2022 වසරේ දී ශ්‍රී ලංකා පොලිසිය උද්ඝෝෂණ විසුරුවා හැරීම සඳහා කඳුළු ගෑස් උණ්ඩ සහ බෝම්බ ඉතා විශාල වශයෙන් යොදා ගෙන තිබේ. ඉතා කෙටි කාලයකදී විශාල කඳුළු ගෑස් ප්‍රමාණයක් මුදා හැරීම ඉතා බයානක විය හැකි බව පර්යේෂකයන් සඳහන් කර ඇත. 2022 මාර්තු 31 වැනිදා ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නිවස අසල පැවැති විරෝධතාවය විසුරුවා හැරීම සඳහා යොදා ගෙන ඇති කඳුළු ගෑස් ප්‍රමාණය 328කි. අප්‍රේල් තුන් වැනිදා පේරාදෙනිය විශ්ව විද්‍යාල සිසුන් පැවැත්වූ උද්ඝෝෂණය විසුරුවා හැරීම සඳහා යොදා ගෙන ඇති කඳුළු ගෑස් උණ්ඩ සහ බෝම්බ ප්‍රමාණය 116කි.

මැයි නව වැනිදා අරලියගහ මැදුර අදලදී යොදා ගත් කඳුළු ගෑස් ප්‍රමාණය 480ක් වන අතර ජුනි නව වැනිදා පොලිස් මූලස්ථානය අසල උද්ඝෝෂණයට යොදා ගත් ප්‍රමාණය 109කි. ජූලි 08 වැනිදා බැංකු මාවත අසල පැවැති අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ විරෝධයට එල්ල කර ඇති කඳුළු ගෑස් උණ්ඩ සහ බෝම්බ ප්‍රමාණය 232කි. මෙම ප්‍රමාණය එල්ල කර ඇත්තේ උස ගොඩනැගිලිවලින් වටවූ ස්ථානයක පැවැති උද්ඝෝෂණයකට වීම විශේෂත්වයකි.
ජූලි 09 වැනිදා බාරොන් ජයතිලක මාවතේ පැවැති විරෝධතාවයට එල්ල කර ඇති කඳුළු ගෑස් ප්‍රමාණය 788කි. ජූලි 13වැනිදා පොල්දූව මංසන්ධියේ පැවැති විරෝධතාවට එල්ල කළ කඳුළු ගෑස් ප්‍රමාණය 660කි.


කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු පහත වගුවේ දැක්වේ.

| | Date | Protest | Division | Number of tear gas used |
|---|---|---|---|---|
| 1 | March 31, 2022 | Mirihana/ Embuldeniya junction | Public Peace Management | 137 |
| 2 | March 31, 2022 | Mirihana/ Embuldeniya junction | Public Peace Management | 135 |
| 3 | March 31, 2022 | Mirihana/Embuldeniya Junction | Feild Force HQ | 56 |
| 4 | April 1, 2022 | Pegiriwatta Junction | Nugegoda | 88 |
| 5 | April 3, 2022 | Peradeniya | Kandy | 116 |
| 6 | April 4, 2022 | Tangalle | Tangalle | 33 |
| 7 | April 4, 2022 | Roshan Ranasinghe's home | Polonnaruwa | 75 |
| 8 | April 4, 2022 | Negambo | Feild Force HQ | 93 |
| 9 | April 4, 2022 | Kandy | Kandy | 32 |
| 10 | April 4, 2022 | | Anuradhapura | 9 |
| 11 | April 5, 2022 | Piliyandala | Mt. Lavinia | 22 |
| 12 | April 5, 2022 | Kesbewa | Mt. Lavinia | 12 |
| 13 | April 5, 2022 | Negambo | Negambo | 80 |
| 14 | April 8, 2022 | Polduwa Juntion | Public Peace Management | 2 |
| 15 | April 19, 2022 | Rambukkana | Kegalle | 10 |
| 16 | April 19, 2022 | Rambukkana | Kegalle | 50 |
| 17 | April 19, 2022 | Rambukkana | Kegalle | 5 |
| 18 | April 19, 2022 | Rambukkana | Kegalle | 88 |
| 19 | April 19, 2022 | Matara Town | Matara | 22 |
| 20 | May 2, 2022 | Polduwa Juntion | Public Peace Management | 127 |
| 21 | May 5, 2022 | Palam thuna Junction | Feild Force HQ | 76 |
| 22 | May 6, 2022 | Polduwa Juntion | Public Peace Management | 76 |
| 23 | May 9, 2022 | Galleface | Public Peace Management | 213 |
| 24 | May 9, 2022 | Temple Tress | Public Peace Management | 150 |


| | | | | |
|---|---|---|---|---|
| 25 | May 9, 2022 | Temple Tress | Public Peace Management | 330 |
| 26 | May 9, 2022 | Temple Tress | PMSD | 113 |
| 27 | May 9, 2022 | Kanchana Wijesekara's Home | Matara | 39 |
| 28 | May 9, 2022 | Siripala Gamlath's Home | Polonnaruwa | 6 |
| 29 | May 9, 2022 | Weeraketiya | Tangalle | 8 |
| 30 | May 9, 2022 | Kandy | Kandy | 55 |
| 31 | May 9, 2022 | | Anuradhapura | 53 |
| 32 | May 10, 2022 | Dompe CIC State | Gampaha | 6 |
| 33 | May 10, 2022 | Nazeer Ahamed's Home | Batticaloa | 58 |
| 34 | May 19, 2022 | Benku Mawatha | Public Peace Management | 15 |
| 35 | May 19, 2022 | Benku Mawatha | Public Peace Management | 44 |
| 36 | May 19, 2022 | Benku Mawatha | Public Peace Management | 22 |
| 37 | May 19, 2022 | Benku Mawatha | Public Peace Management | 64 |
| 38 | May 19, 2022 | Benku Mawatha | Colombo Central | 27 |
| 39 | May 21, 2022 | Benku Mawatha | Public Peace Management | 17 |
| 40 | May 21, 2022 | Benku Mawatha | Public Peace Management | 61 |
| 41 | May 21, 2022 | Benku Mawatha | Colombo Central | 23 |
| 42 | May 28, 2022 | Benku Mawatha | Public Peace Management | 31 |
| 43 | May 29, 2022 | Benku Mawatha | Public Peace Management | 15 |
| 44 | May 29, 2022 | Benku Mawatha | Public Peace Management | 39 |
| 45 | June 9, 2022 | Police HQ | Public Peace Management | 109 |
| 46 | June 9, 2022 | Chetham Street | Colombo Central | 6 |
| 47 | June 9, 2022 | Police HQ | Colombo Central | 23 |
| 48 | June 10, 2022 | Min. of Education | Public Peace Management | 123 |

| | | | | |
|---|---|---|---|---|
| 49 | July 6, 2022 | Chetham Street | Public Peace Management | 27 |
| 50 | July 6, 2022 | Polduwa Juntion | Public Peace Management | 8 |
| 51 | July 6, 2022 | Aragalaya | Feild Force HQ | 18 |
| 52 | July 8, 2022 | Benku Mawatha | Public Peace Management | 51 |
| 53 | July 8, 2022 | Benku Mawatha | Public Peace Management | 181 |
| 54 | July 9, 2022 | Baron Jayathilaka Mw | Public Peace Management | 505 |
| 55 | July 9, 2022 | Baron Jayathilaka Mw | Public Peace Management | 283 |
| 56 | July 9, 2022 | Chetham Street | Public Peace Management | 257 |
| 57 | July 9, 2022 | Kingsbery Hotel | Public Peace Management | 109 |
| 58 | July 9, 2022 | President Secretariat | Public Peace Management | 4 |
| 59 | July 9, 2022 | Kuruduwatta 5th Lane | Public Peace Management | 355 |
| 60 | July 9, 2022 | Ranil's Home | Colombo South | 16 |
| 61 | July 9, 2022 | Ranil's Home | Colombo South | 45 |
| 62 | July 9, 2022 | Ranil's Home | Colombo South | 20 |
| 63 | July 9, 2022 | Ranil's Home | PMSD | 208 |
| 64 | July 9, 2022 | Aragalaya | Feild Force HQ | 11 |
| 65 | July 9, 2022 | Kingsbery Rd | Colombo Central | 68 |
| 66 | July 9, 2022 | Baron Jayathilaka Mw | Colombo Central | 29 |
| 67 | July 9, 2022 | Fare Way Rd | Colombo Central | 5 |
| 68 | July 9, 2022 | Cannels Rd | Colombo Central | 30 |
| 69 | July 9, 2022 | Baron Jayathilaka Mw | PSD | 4 |
| 70 | July 9, 2022 | Mudalige Mw | PSD | 3 |
| 71 | July 9, 2022 | Chetham Street | PSD | 4 |
| 72 | July 9, 2022 | Selinco Rd | PSD | 4 |
| 73 | July 12, 2022 | Aragalaya | Feild Force HQ | 15 |
| 74 | July 13, 2022 | Polduwa Juntion | Public Peace Management | 340 |
| 75 | July 13, 2022 | Polduwa Juntion | Public Peace Management | 340 |
| 76 | July 13, 2022 | Prime Minister Office | Public Peace Management | 410 |
| 77 | July 13, 2022 | Prime Minister Office | Public Peace Management | 340 |
| 78 | July 13, 2022 | Prime Minister Office | Colombo South | 14 |
| 79 | July 13, 2022 | Prime Minister Office | Colombo South | 38 |
| 80 | July 13, 2022 | Prime Minister Office | PMSD | 142 |

## කල් ඉකුත් වූ කඳුළු ගෑස්


True Copy

Officer-In-Charge
Central Armoury
Field Force Headquarters
Colombo 05


2414211
A
28

කල් ඉකුත් වූ කඳුළු ගෑස් සම්බන්ධයෙන් තොරතුරු පනත යටතේ නිශ්චිත ප්‍රශ්න කිහිපයක් ශ්‍රී ලංකා පොලිසිය වෙත යොමු කළ ද ඊට පිළිතුරු ලෙස පොලිස්පති සී ඩී වික්‍රමරත්නගේ අත්සනින් මෙන්ම සෙසු නිලධාරීන් ද ලබා දී තිබුණු පිළිතුර වූයේ කල් ඉකුත් වූ කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කර නැති බවයි.

ශ්‍රී ලංකා පොලිසිය 2022 වසරේ දී එල්ල කළ කඳුළු ගෑස් ප්‍රහාරවලින් වැඩි ප්‍රමාණයක් කල් ඉකුත් වූ කඳුළු ගෑස් වුව ද ඒ බව සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් ඇතැම් ලේඛණ ශ්‍රී ලංකා පොලිසිය තොරතුරු පනත යටතේ ලබා දුන්නේ නැත. උදාහරණයක් ලෙස කඳුළු ගෑස් වැඩිම ප්‍රමාණයක් එල්ල කරන ලද මහජන සාමය කළමනාකරණ කොට්ඨාසය එම තොරතුරු මේ වන තෙක් මුදා හැර නැත. කොළඹ දකුණ කොට්ඨාසය, ගල්කිස්ස කොට්ඨාසය, කොළඹ මධ්‍යම කොට්ඨාසය, මඩකලපුව, මහනුවර, අනුරාධපුරය, කෑගල්ල,මාතර, පොළොන්නරුව සහ තංගල්ල කොට්ඨාසවලින් කල් ඉකුත් වූ කඳුළු ගෑස් 2022 වසරේදී එල්ල කර ඇති බව සනාථ කළ හැකි ලේඛන ඇති අතර ඒවා ඇමුණුම් කොටසේ ඇත.


2022 වසරේ දී එල්ල කරන ලද කඳුළු ගෑස් අතර 2000, 2010, 2011, 2012, 2014, 2016, 2017, 2018, 2019, 2020 යන වසරවල මිලදී ගත් හෝ බේදා හැර ඇති කඳුළු ගෑස් උණ්ඩ සහ බෝම්බ තිබේ. මේ බව සනාථ කෙරෙන ලේඛන සාක්කි තිබේ. ඊට අමතරව ලේඛන සාක්කි නැතත් ඡායාරූප සාක්කි අනුව 2005 වසරේ නිශ්පාදිත කඳුළු ගෑස් පවා එල්ල කර තිබේ.

සාමාන්‍යයෙන් කඳුළු ගෑස් උණ්ඩයක හෝ බෝම්බයක ආයුකාලය වසර 05කි.

කල් ඉකුත් වූ කඳුළු ගෑස් සම්බන්ධයෙන් විද්‍යාඥයන් අතර විවිධ මත පවතී. ඇතැම් පිරිස් ප්‍රකාශ කරන්නේ කඳුළු ගෑස් කල් ඉකුත් වීම නිසා ඒවායේ ප්‍රභලතාව නැතිවී ගොස් එයින් සිදුවන බලපෑම අවම වන බවයි. එහෙත්





තවත් පිරිසක් ප්‍රකාශ කරන්නේ කල් ඉකුත් වූ කඳුළු ගෑස් නිසා භයානක තත්ත්වයන්වලට මුහුණ දීමට සිදුවිය හැකි බවයි. විශේෂයෙන්ම කල් ඉකුත්වීමෙන් පසු එනම් දීර්ඝ කාලයක් තිස්සේ රසායන ද්‍රව්‍ය කඳුළු ගෑස් උණ්ඩය හෝ බෝම්බය ඇතුළේ පැවතීම නිසා එය වෙනස්කම්වලට භාජනය වීමෙන් ප්‍රභලත්වය වැඩි විය හැකි බවත්, කල් ඉකුත් වූ කඳුළු ගෑස් උණ්ඩ භාවිත කරන අවිය පවා පුපුරා යෑමට ඉඩ කඩ ඇති බවත් ඔවුහු සඳහන් කරති. 2022 uehs ui 09 jeksod wr,sh.y ukaÈrh wi, rdcldß lrñka isá Wm පොලිස් පරීක්ෂකවරයකු ද කඳුළු ගෑස් අවියක් පිපිරීම නිසා මිය ගිය බව මාධ්‍ය වාර්තා කළේය. කල් ඉකුත් වූ කඳුළු ගෑස්වල බලපෑම සම්බන්ධයෙන් සොයා බැලීමට පරීක්ෂණයක් සිදු කර ඇති බවට පිළිගත හැකි තොරතුරු කිසිවක් සොයා ගැනීමට නොහැකි විය.

පොලිසිය තොරතුරු පනත යටතේ තොරතුරු ලබා දෙද්දී ඇතැම් තොරතුරු අතර කඳුළු ගෑස් ඒ ඒ කොට්ඨාසවලට බෙදා හැරි වසර සඳහන් කර තිබේ. උදාහරණයක් ලෙස කොළඹ දකුණ කොට්ඨාසය 2022 වසරේදී භාවිත කළ කඳුළු ගෑස් බෙදා හැර ඇත්තේ 2017, 2018 සහ 2019 වසරවලදී බව සඳහන්වේ. 2017 සහ 2018 වසරවලදී බෙදා හැර ඇත්තේ 2017 දී මෙරටට ගෙන්වූ කඳුළු ගෑස් හෝ ඊට පෙර ගෙන්වූ කඳුළු ගෑස් විය යුතුය. 2017 වසරේ දී ගෙන්වූ කඳුළු ගෑස්වල නිශ්පාදිත වසර වූයේ 2016 වසරයි. ඊට අදාල ලේඛනවල සඳහන් වන්නේ එම කඳුළු ගෑස්වල ආයුකාලය වසර පහක් බවයි. ඒ අනුව 2021 වසරෙන් එම කාලය අවසන්වේ. එම කඳුළු ගෑස් 2022 වසරේ එල්ල කරන විට ඒවා කල්ඉකුත්වී හමාරය.

2022 වසරේ දී එල්ල කරන ලද කඳුළු ගෑස් උණ්ඩ සහ බෝම්බ මිලදී ගත් වසර හෝ අදාල කොට්ඨාසයට බෙදා හැරි වසර පහත දක්වේ.

| Using Tear gas from 31ts March 2022 to 2022 July 17 | | | |
|---|---|---|---|
| **Police Division** | **How many incidents** | **How much used** | **Year of purchased or year distributed to the division** |
| Colombo South | 5 | 133 | 2017, 2018, 2019 Distributed |
| Gampaha | 1 | 6 | Not given the year |
| Field force HQ | 6 | 269 | Not given the year |
| Mount Lavinia | 2 | 36 | 2017, 2019, 2020 purchased |
| Colombo Central | 8 | 211 | 2017, 2019, 2020 purchased |
| Nugegoda | 1 | 88 | Not given the year |
| Negambo | 1 | 80 | Not given the year |
| Batticaloa | 1 | 58 | 2017, 2020 |
| Kandy | 6 | 116 | 2017, 2019, 2020 purchased |
| Anuradhapura | 2 | 64 | 2018, 2022 Distributed |
| President Security Division | 1 | 15 | 2019 |
| STF | 4 | 155 | 2018, 2022 |
| Kegalle | 4 | 153 | 2000, 2017, 2019 |
| Primeminister Security Division | 3 | 321 | 2019, 2022 |
| Public peace management division | 33 | 4834 | 2017, 2019, 2020 purchased |
| Matara | 2 | 61 | 2011, 2012, 2014, 2018, 2019 |
| Polonnaruwa | 2 | 81 | 2017, 2019, 2020 purchased |
| Tangalle | 2 | 41 | 2010, 2019 |
| | **84** | **6722** | **2000, 2010, 2011, 2012, 2014, 2016, 2017, 2018, 2019, 2020, 2021, 2022** |

## කඳුළු ගෑස් වියදම

2012 වසරේ සිට 2022 වසර දක්වා කඳුළු ගෑස් මිලදී ගැනීම සඳහා ගොස් ඇති මුළු මුදල රුපියල් 162,101,131.66කි. 2022 මාර්තු 31 සිට 2022 ජූලි 17 වැනිදා තෙක් එල්ල කර ඇති කඳුළු ගෑස්වල වටිනාකම රුපියල් 26,706,578.17කි. ඊට අදාල තොරතුරු පහත වගුවේ ඇත.

**Using Tear gas from 31ts March 2022 to 2022 July 17**

| Police Division | How many incidents | How much used | Expences Rs. |
|---|---|---|---|
| Colombo South | 5 | 133 | 349,337.86 |
| Gampaha | 1 | 6 | 15,759.60 |
| Field force HQ | 6 | 269 | 1,166,243.09 |
| Mount Lavinia | 2 | 36 | 124,701.06 |
| Colombo Central | 8 | 211 | 554,212.70 |
| Nugegoda | 1 | 88 | 231,140.84 |
| Negambo | 1 | 80 | 210,128.04 |
| Batticaloa | 1 | 58 | 220,165.58 |
| Kandy | 6 | 116 | 440,331.16 |
| Anuradhapura | 2 | 64 | 281,140.35 |
| President Security Divistion | 1 | 15 | 84,614.18 |
| STF | 4 | 155 | 407,123.07 |
| Kegalle | 4 | 153 | 680,696.75 |
| Primeminister Security Division | 3 | 321 | 1,084,286.32 |
| Public peace management division | 33 | 4834 | 20,059,523.49 |
| Matara | 2 | 61 | 160,222.63 |
| Polonnaruwa | 2 | 81 | 529,260.83 |
| Tangalle | 2 | 41 | 107,690.62 |
| | **84** | **6722** | **26,706,578.17** |

## ජාත්‍යන්තර මගපෙන්වීම් සහ ලංකාවේ නීතිය

1925 වසරේ දී ජිනීවා ප්‍රටකෝල් මගින් අන්තර් ජාතික යුද්ධ වලදී කඳුළු ගෑස් භාවිත තහනම් කර තිබේ. එහි කඳුළු ගෑස් යන වචනය සඳහන් කර නැතත් හුස්ම හිරවීම සිදු විය හැකි හෝ විෂ සහිත හෝ වෙනත් වායූන් හෝ භාවිත නොකළ යුතු බව සඳහන්වේ. මෙම කාණ්ඩ තුන යටතට කඳුළු ගෑස් වැටෙන බව කඳුළු ගෑස් සම්බන්ධයෙන් ඇති වාර්තාවල සඳහන් වේ. එසේ නොවැටෙන බවට ප්‍රතික්ෂේප කරන පිරිස් ද සිටිති.

රසායන අවි සම්මුතිය මගින් ද ජාත්‍යන්තර යුද්ධවලදී රසායනික අවි භාවිත තහනම් කර තිබේ. කෙසේ වෙතත් රටවල් ඇතුළේ කැරලි මර්දනය සඳහා ඒවා යොදා ගැනීම ගැනීම තහනම් කර නැත.

අන්තර් ජාතික මානව හිමිකම් සංවිධානයක් වන එෆ්අයිඩීඑච් ආයතනය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් 2023 ජනවාරි මාසයේ දී පළ කළ වාර්තාවක (Anatomy of a crackdown – එයැ repression of Sri Lanka’s protest movement) කඳුළු ගෑස් භාවිත කිරීමේදී ලෝකයේ පිළිගත් මගපෙන්වීම් උපුටා දක්වා තිබේ. ඒවා මෙසේය.

‘ශ්‍රී ලංකාව අන්තර්ජාතිල සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් සම්මුතියේ පාර්ශ්වකාරයකු වී ඇති බැවින් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම සම්මුතියේ 21 වගන්තියේ සීමාවන්ට යටත්ව ක්‍රියාත්මක කළ යුතු වේ. එහිදී පාලකයන් විසින් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම සීමා කරන විට වගන්තියේ ඇති සීමාකිරීමේ අවශ්‍යතාවය හා සමානුපාතිකත්වය අනිවාර්යෙන් ම සලකා බැලිය යුතු වේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස්වරයා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමාරිස් කාර්යාලයේ මාර්ගෝපදේශ ඉස්මතු කරමින් පෙන්වා දෙන්නේ සාමකාමී රැස්වීමක් විසුරුවා හැරීමේදී ජීවතයට ඇති වන හානිය

අවම වන අයුරින් විසුරුවීම කළ යුතු බවයි. එහිදී තනි ඉලක්ක අරමුණු නොකළ යුතු බවද සඳහන් කරයි.
කඳුළු ගෑස් අන්තර්ජාතික ප්‍රතිපාදන වලට අනුකූල නොවන අවස්ථා
1) ශ්‍රී ලංකාව තුළ සමාන්‍ය පරිචය වන්නේ, සාමකාමී ප්‍රචණ්ඩ නොවන හා රාජ්‍ය ආරක්ෂාවට තර්ජනයක් නොවන රැස්වීමක් පවා බලය භාවිතා කර විසුරුවා හැරීමයි. නමුත් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ මාර්ගෙ ෝපදේශ අනුව දක්වන්නේ කඳුළු ගෑස් ගැසීම සිදු කළ යුත්තේ සාමකාමී රැස්වීම විසුරුවීමට වෙනත් කිසිදු විසඳුමක් නැතිවු විටකදී පමණි. එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම වලට අනුව නීතිවිරෝධී වුවත් සාමකාමී වන්නේ නම් බලය භාවිතා කළ නොහැකිය.

2) පූර්ව දැනුවත් කිරීමක් නොමැති වීම.
මාර්ගෝපදේශ වලට අනුව ජීවත හානියක් සිදු විය හැකි ආයුධ භාවිත කර රැස්වීමක් විසුරුවන්නේ නම් එහිදි ප්‍රමාණවත් පූර්ව දැනුම්වත් කිරීමක් සිදු කළ යුතු අතර රැස්ව සිටින්නන්ට විසිරී යෑමට ප්‍රමාණවත් කාලයක්ද ලබා දිය යුතුබවයි.

3) දිගින් දිගටම කඳුළු ගෑස් භාවිතා කර රැස්වීම විසුරුවීම.
එකම රැස්වීමකදී විශාලා ප්‍රමාණයක් කඳුළු ගෑස් ගැසීමත්, දීර්ඝ කාලයක් බලපෑම් සහිත කඳුළු ගෑස් භාවිත කිරීමත් සෞඛ්‍යයට අතිශයින් අහිතකර තත්ත්වයක් බව මාර්ග පෝදශවල සඳහන්වෙයි. 2022 ජුලි මස 9 වන දින ශ්‍රී ලංකාව තුළ එලෙස කඳුළු ගෑස් භාවිතා කිරීමේ ස්වරූපයක් පැවතුණි.

3) සෘජුවම උද්ඝෝෂණකරුවන් එල්ල කර කඳුළු ගෑස් ගැසීම.
මාර්ගෝපදේශවලට අනුව කඳුළු ගෑස් ගැසීමේදී කිසිදු විටක රැස්වසිටින්නන් තනිව හෝ ඔවුන්ගේ හිස ඉලක්ක කරගෙන කඳුළු ගෑස් ගැසිය යුතු නැති අතර ඉහළ අහස ඒ සඳහා ඉලක්කයක් වශයෙන් භාවිතා කළ යුතු වේ.
4) කොටු වූ ප්‍රදේශයකදී භාවිතා කිරීම.

කඳුළු ගෑස් භාවිතා කරන්නේ නම් රැස්ව සිටින්නනට විසුරුවීමට ඉඩ පහසුකම් තිබිය යුතු වේ. රැස්ව සිටින්නන්ට විසිරීමට ඉඩ නොදී සීමාවක් තුළ රඳවා කඳුළුගෑස් ගැසීමෙන් මරණීය හානි විය හැකි වේ.

5) ළමයින්ට බලපෑමක් ඇති වීම.

බලය යෙදීමේදී කඳුළු ගෑස් භාවිතා කරන්නේ නම් රැස්ව සිටින්නන් වෙනස්කොට හඳුනාගත යුතු වේ. එසේ නොමැත නම් ළමයින් ආසන්න වපසරිය තුළ සිටිනවාද යන්න කලින් පරීක්ෂා කළ යුතු වේ. නිසි ලෙස වෙනස්කොට නොදක්වා කඳුළු ගෑස් භාවිතා කිරීමෙන් ආසන්නයේ සිටින ළමයින්ට ජීවිත හානි ඇති කළ හැකි වේ.

ඉහත සඳහන් කරුණු කෙසේ වෙතත් ලෝකයේ දැන් අවධානය යොමු වී ඇත්තේ කඳුළු ගෑස් භාවිතය සම්පූර්ණයෙන්ම නතර කිරීම සඳහාය. කඳුළු ගෑස්වලට නිරාවරණය වූවන් මරණයට පත්වීම ගැන ලෝකයේ උදාහරණ තිබේ. ඒ සම්බන්ධයෙන් මෙම වාර්තාවේ අවසානයට ඇති ඇමිණුම්වල ඇත.

ශ්‍රී ලංකාවේ කඳුළු ගෑස් එල්ල කිරීමට අදාලව නිශ්චිත නීතියක් සොයා ගත නොහැකි විය. මේ සම්බන්ධයෙන් පොලිස් ප්‍රධානීන්ගෙන්ගෙන් විමසද්දී ඔවුන් ප්‍රකාශ කළේ අවම බලය යටතේ කඳුළු ගෑස් එල්ල කරන බවයි. කැරලි මර්දනය ගැන සඳහන් වෙන දෙපාර්තමේන්තු නියෝග වල කඳුළු ගෑස් සම්බන්ධයෙන් සඳහනක් නැත.

කඳුළු ගෑස්වලින් විය හැකි හානිය ගැන අන්තර්ජාතික පරීක්ෂණ වාර්තා පරීක්ෂා කරද්දී පෙනී යන්නේ කඳුළු ගෑස් භාවිතය යනු උද්ඝෝෂණ විසිරුවා හැරීම සඳහා රසායන අවියක් භාවිත කිරීමක් බවයි. එසේම එය කෲර අමානුෂික සහ අවමන් සහගත සැලකීම්වලට ලක්නොවී සිටීමේ අයිතිවාසිකම ද උල්ලංඝණය කිරීමක් සේ සැලකිය හැකිය.

## සොයාගැනීම්

1) ශ්‍රී ලංකා පොලිසියට කඳුළු ගෑස් මිලදී ගැනීමේ දී ඒවායේ අන්තර්ගතය ගැන රසායනාගාර පරීක්ෂණයක් සිදු කර නැත. නිශ්පාදකයා හෝ ලංසු තැබූ ආයතනය ලබා දුන් තොරතුරු ඒ ආකාරයෙන්ම පිළිගෙන ඒවායේ අන්තර්ගතය කිසිම පරීක්ෂාවකට භාජනය කර නැත. ඇතැම් මිලදී ගැනීම්වලදී අඩු තරමේ කඳුළු ගෑස්වල ඇති රසායන සංයුතියවත් නිශ්පාදකයා සඳහන් කර නැත. එවැනි අවස්ථාවල පොලිසිය විමසද්දී ඒවා ප්‍රමිතියට අනුව නිශ්පාදනය කර ඇති බව පමණක් එම සමාගම් සඳන් කළ බව පොලිසිය ලිඛිතව පිළිගෙන තිබේ.

2) ශ්‍රී ලංකා පොලිසියට කඳුළු ගෑස් මිලදී ගැනීමේදී ඊට අදාල තාක්ෂණික ඇගයුම් කමිටුවල කඳුළු ගෑස් සම්බන්ධ විශේෂඥ දැනුමක් ඇති සාමාජිකයකු පත් කර නැත.

3) ශ්‍රී ලංකා පොලිසිය 2022 වසරේ දී උද්ඝෝෂණ විසිරුවා හැරීම සඳහා කල් ඉකුත් වූ කඳුළු ගෑස් යොදාගෙන තිබේ. ඒ අතර 2000 වසරේ සිට නිෂ්පාදිත කඳුළු ගෑස් තිබී ඇත.

4) 2012 වසරේ කඳුළු ගෑස් බෝම්බ සහ උණ්ඩ 20,000ක් මිලදී ගෙන ඇති අතර 2012 සිට 2016 අතර කාලයේදී භාවිත වී ඇත්තේ කඳුළු ගෑස් උණ්ඩ සහ බෝම්බ 2306ක් පමණි. ඉතිරි කඳුළු ගෑස් තොගය 2017 වසරෙන් කල් ඉකුත් වුවද ඒවා ඉවත් කර විනාශ කර නැත.

5) 2012 වසරේ මිලදී ගත් කඳුළු ගෑස් 20,000ක ප්‍රමාණය 2017 වසරේදීත්, 2017 දී මිලදී ගත් ප්‍රමාණය 2021 වසරේදීත් කල් ඉකුත් වූ අතර 2019 වසරේදී මිලදී ගත් කඳුළු ගෑස් 15,000ක ප්‍රමාණය ද 2023 එනම් මෙම වසරේදී කල් ඉකුත්වේ. ඒ අනුව කඳුළු ගෑස් උණ්ඩ සහ බෝම්බ 40,000ක ප්‍රමාණයක් කල් ඉකුත් වේ. 2012 වසරේ සිට 2022 ජූලි 20 දක්වා ශ්‍රී ලංකා පොලිසිය භාවිත කර ඇති කඳුළු ගෑස් ප්‍රමාණය 8265කි. එම සංඛ්‍යාව 2012, 2017 සහ 2019 මිලදී ගත් කඳුළු ගෑස් බවට අනුමාන කළත් තවදුරටත් එම තොගවලින් ඉතිරිව ඇති ප්‍රමාණය 31735කි. එනම් අඩු තරමේ කඳුළු ගෑස් උණ්ඩ සහ

බෝම්බ 31000ක්වත් ශ්‍රී ලංකා පොලිසියේ තවදුරටත් ඉතිරිව තිබේ.

6) ගිනි අවි අසලදී කඳුළු ගෑස් භාවිත නොකරන ලෙස කඳුළුගෑස් නිශ්පාදකයන් ඒවා පොලිසියට ලබා දෙද්දී බාර දුන් පත්‍රිකාවල සඳහන් වුවද 2022 වසරේ දී කඳුළු ගෑස් වැඩි ප්‍රමාණයක් එල්ල කළේ ගිනිඅවි අසලදීය.

7) කඳුළු ගෑස් භාවිත කළ යුත්තේ පුහුණු නිලධාරීන් පමණක් බව සහ උද්ඝෝෂකයන් වෙත කෙලින් එල්ල නොකළ යුතු බව අදාල සමාගම් පොලිසියට බාර දුන් ලේඛනවල ඇතත් නුපුහුණු නිලධාරීන් පවා 2022 වසරේ දී කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කර ඇති අතර උද්ඝෝෂකයන් ඉලක්ක කර ගනිමින් කෙලින්ම ප්‍රහාර එල්ල කළ අවස්ථා ද වාර්තා විය. එලෙස එල්ල කිරීම් නිසා කිහිප දෙනෙක් තුවාල ලැබූහ.

8) උද්ඝෝෂණ විසිරුවා හැරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය කිසිම ක්‍රමවේදයක් හෝ අධීක්ෂණයක් නැතිව ඉතා විශාල ප්‍රමාණවලින් කඳුළු ගෑස් උණ්ඩ සහ බෝම්බ යොදාගෙන තිබේ.

9) ලංකාවේ මූල්‍ය අර්බුදයක් පැවති 2022 වසරේ මාර්තු 31 වැනිදා සිට ජූලි 20 වැනිදා තෙක් ශ්‍රී ලංකා පොලිසිය අවස්ථා 84කදී කඳුළු ගෑස් උණ්ඩ සහ බෝම්බ 6722ක් භාවිත කර ඇති අතර ඒවායේ වටිනාකම රුපියල් 26,706,578.17කි.

10) තොරතුරු පනත යටතේ තොරතුරු ලබා දෙද්දී ශ්‍රී ලංකා පොලිසියේ පොලිස්පතිවරයා මෙන්ම මෙම කටයුත්තකට අදාලව ලේඛන සැපයූ ඇතැම් නිලධාරීන් ව්‍යාජ සහ නොමග යවන තොරතුරු ලබා දී තිබේ.

11) ශ්‍රී ලංකා පොලිසිය ගොඩනැගිලිවලින් වටවූ පිරිසිදු වාතාශ්‍රය ලැබීමට වැඩි වේලාවක් යන ප්‍රදේශවලදී පවා කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කර තිබේ.

12) ශ්‍රී ලංකා පොලිසි විවිධ කොට්ඨාසවලට බෙදා හැර තිබූ කල් ඉකුත් වූ කඳුළු ගෑස් කොළඹ උද්ඝෝෂණ සඳහා භාවිත කිරීමට 2022 දී නැවත කොළඹට ගෙන්වාගෙන තිබේ.

13) ශ්‍රී ලංකා පොලිසිය ළමයින්, ආබාධිතයන් සහ හෘද්ධ රෝගීන් සිටින උද්ඝෝෂණවලට ද 2022 වසරේ දී කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කර තිබේ.

14) ශ්‍රී ලංකා පොලිසිය උද්ඝෝෂකයන්ට විසිරී යන ලෙස නියෝග කිරීමකින් තොරව පවා කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කර තිබේ.

15) කල් ඉකුත් වූ කඳුළු ගෑස් ඉවත් කිරීම සඳහා 2022 දෙසැම්බර් වන විටවත් පොලිස්පතිවරයා කටයුතු කර නොතිබූ අතර කල් ඉකුත්වූ කඳුළු ගෑස් එල්ල කිරීම අසත්‍ය බව පෙන්වීමට ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර තිබේ.

# ඇමුණුම්

ඇමුණුම්-

# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

තරිඳු ජයවර්ධන
සමාජය හා සාමයික කේන්ද්‍රය
අංක 281, ඩීන්ස් පාර,
කොළඹ 10

**අභියාචක**

**අභියාචනා අංක :**
**RTIC Appeal No 927/2022**
**RTIC Appeal No 928/2022**
**RTIC Appeal No 929/2022**

**එදිරිව**

ශ්‍රී ලංකා පොලීසිය
පොලිස් මූලස්ථානය
කොළඹ 01

**පොදු අධිකාරිය**

**ඉදිරිපිටදී** :
1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
5. මොහොමඩ් නහියා - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සිටී. අභියාචක වෙනුවෙන් නීතිඥ සුරේන් ද පෙරේරා මයා සහ නීතිඥ මනුෂිකා කුරේ මිය පෙනී සිටී.

පොදු අධිකාරිය වෙනුවෙන් උප පොලිස් පරීක්ෂක එස්.එම්. බෝදරගම මයා (මානව හිමිකම් කොට්ඨාසය) පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - 2022.10.06 ,2022.10.17
පොදු අධිකාරිය - 2022.09.08, 2022.09.30

**විභාග කළ දිනය** : 2022.09.01, 2022.09.14, 2022.10.06

**තීරණය කළ දිනය** : 2022.10.27

**කොමිෂන් සභාවේ තීරණය:**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් එකම තොරතුරු ඉල්ලීමක් එකම පොදු අධිකාරියක තොරතුරු නිලධාරීන් තිදෙනෙකු වෙත සිදුකර පසුව නම්කල නිලධාරිට අභියාචනා සිදුකිරීමෙන් පසුව කොමිෂන් සභාවට වෙන් වෙන්ව

අභියාචනා කර ඇති අතර එකම පොදු අධිකාරියක් වෙත සිදුකරන ලද සමාන තොරතුරු ඉල්ලීම් තුනක් පිලිබඳව අභියාචනයක් බැවින් ඉහත අභියාචනාවන් එක්ව ගෙන විභාග කිරීමට කොමිෂන් සභාව අභියාචනා විභාගය ආරම්භයේදී තීරණය කල අතර ඒ සඳහා පාර්ශවයන්ගේ එකගතාවයද හිමිවිය.

ඒ් අනුව අභියාචක විසින් 2022.07.17 දිනැති තොරතුරු ඉල්ලීම, පොලිස් සැපයුම් කොට්ඨාශයට සහ පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයටද අභියාචක විසින් 2022.07.20 දිනැති තොරතුරු ඉල්ලීම, පොලිස් මූලස්ථානය යන ස්ථානවල තොරතුරු නිලධාරීන් වෙත ඉදිරිපත් කරමින් පහත තොරතුරු ඉල්ලා ඇත.

> *" මේ දිනවල පවත්වන විරෝධතා විසුරුවීමට දිගින් දිගටම කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කරන අතර එම නිසා බොහෝ පිරිසක් රෝගාතුර වී සිටිති. මේ හේතුවෙන් තොරතුරු පනතේ 25(3) යටතේ පහත දැක්වෙන තොරතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු.*
>
> *ඉල්ලා සිටින තොරතුරු -*
>
> *2010 ජනවාරි 1 වන දින සිට 2022 ජනවාරි 1 වන දක්වා කාලය තුළ,*
>
> 1. *ලංකාවට ගෙන්වා ඇති කඳුළු ගෑස් ප්‍රමාණය කොපමණද?*
> 2. *ලංකාවට අවස්ථා කීයකදී කඳුළු ගෑස් ගෙන්වා තිබේද?*
> 4. *එම එක් එක් අවස්ථාවේදී වියදම් වූ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන්ව කොපමණක් ද?*
> 5. *එලෙස කඳුළු ගෑස් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දුන් ලේඛන මොනවාද? එලෙස කඳුළු ගෑස් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවූ ලේඛනවල සහතික පිටපත් ලබා දෙන්න.*
> 6. *එම සෑම අවස්ථාවකටම අදාල තාක්ෂණික ඇගයුම් කමිටු වාර්තා වල සහතික පිටපත් ලබා දෙන්න.*
> 7. *එම සෑම අවස්ථාවකටම අදාල ටෙන්ඩර් ප්‍රදානය කළ ලිපිවල සහතික පිටපත් ලබා දෙන්න.*
> 8. *මෙම තොරතුරු ඉල්ලීමට පාදක වන කාලසීමාවේදී කඳුළු ගෑස් භාවිත කළ ප්‍රමාණය වාර්ෂිකව ලබා දෙන්න.*
> 9. *පසුගිය දිනවල කල් ඉකුත් වූ කඳුළු ගෑස් කොපමණ ප්‍රමාණයක් භාවිත කළේද?*
> 10. *එලෙස භාවිත කිරීමට හේතුව කුමක්ද?*
> 11. *කල් ඉකුත් වූ කඳුළු ගෑස් භාවිත කිරිමට අවසර ගත්තේ කාගෙන්ද? ඊට අදාල ලේඛණවල සහතික පිටපත් ලබා දෙන්න.*
> 12. *2022 මාර්තු 31 සිට 2022 ජුලි 17 තෙක් කඳුළු ගෑස් ප්‍රහාර අවස්ථා කොපමණ ප්‍රමාණයකදී එල්ල කර තිබේද?*
> 13. *එලෙස එල්ල කළ අවස්ථා වලදී භාවිත කරන ලද කඳුළු ගෑස් ප්‍රමාණයන් මොනවාද? ඒ බව සඳහන් වන ලේඛනවල සහතික පිටපත් ලබා දෙන්න.*
> 14. *එම අවස්ථාවලදී භාවිත කළ කඳුළු ගෑස් කුමන වසරවල මිලදී ගත් කඳුළු ගෑස්ද? ඊට අදාල සියලු ලේඛනවල සහතික පිටපත් ලබා දෙන්න."*

<u>පොලිස් සැපයුම් කොට්ඨාශය වෙත ඉදිරිපත් කල තොරතුරු ඉල්ලීමට</u>

තොරතුරු නිලධාරි විසින් පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2022.07.20 දිනැතිව නම්කළ නිළධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත. කෙසේවූවද, තොරතුරු නිලධාරී විසින් 2022.07.27 දිනැතිව තොරතුරු ඉල්ලීමට පහත පරිදි ප්‍රතිචාර දක්වා ඇත.

> *" ඔබගේ ලිපියට අනුව තොරතුරු ලබා දීම සඳහා අධ්‍යක්ෂ නීති කොට්ඨාසය මගින් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන ලදී. ලබා දී ඇති උපදෙස් වලට අනුව පහත වාර්තා ඉදිරිපත් කරමි.*

*ඉහත ඉල්ලීම, තොරතුරු දැනගැනීමේ පනතේ 24(5) (අ) සහ (ආ) යටතේ දක්වා ඇති ප්‍රතිපාදන අනුව ඉල්ලුම් කර නොමැති බව පෙන්වාදී ඇති බැවින් ඔබගේ ලිපියට අනුව කටයුතු කිරීමට නොහැකි බව දන්වා සිටිමි."*

නම්කළ නිළධාරි විසින් ද පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2022.07.28 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත. එකී අභියාචනය කොමිෂන් සභාවේ RTIC Appeal /927/2022 ලෙස ලියාපදිංචි කර ඇත.

*පොලිස්ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ තොරතුරු නිළධාරි වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලීමට*

තොරතුරු නිලධාරි විසින් පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2022.07.20 දිනැතිව නම්කළ නිළධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිළධාරි විසින් ද පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2022.07.27 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත. එකී අභියාචනය කොමිෂන් සභාවේ RTIC Appeal /928/2022 ලෙස ලියාපදිංචි කර ඇත.

*පොලිස්මූලස්ථානයේ තොරතුරු නිළධාරි වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලීමට*

තොරතුරු නිලධාරි විසින් පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2022.07.20 දිනැතිව නම්කළ නිළධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත. කෙසේවූවද, තොරතුරු නිලධාරී විසින් 2022.07.21 දිනැතිව තොරතුරු ඉල්ලීමට පහත පරිදි ප්‍රතිචාර දක්වා ඇත.

*"ඔබ විසින් 2022.07.18 වන දින මාගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කරන ලද කඳුළු ගෑස් සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමේ පනතේ 25(3) වගන්තිය අනුව ඉල්ලා ඇති තොරතුරු පිලිබදවයි.*

*2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබද පනතේ II කොටසේ 5(අ) I වගන්ති අනුව තොරතුරු හෙළිදරව් කිරීම තුලින් රාජ්‍ය ආරක්ෂාවට හෝ එහි භෞමික අඛණ්ඩතාවයට හෝ ජාතික ආරක්ෂාවට බරපතල ලෙස අගතිදායක වන අවස්ථාවක එම තොරතුරු වලට ප්‍රවේශවීමේ අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කල හැකිය. ඒ අනුව ඔබගේ ලිපියේ කරුණු අංක 08,09,10,11,12,13 සහ 14 යටතේ ඉල්ලුම් කර ඇති තොරතුරු ලබා දිය නොහැකි බවත්,*

*ශ්‍රී ලංකා පොලිසියේ නඩු කටයුතු වලට අදාල නොවන පැරණි ලේඛන වසර 05ට වරක් විනාශ කරන බැවින් ඔබ විසින් ඉල්ලා ඇති කරුණු අංක 01,02,03,04,05,06, සහ 07 යටතේ ඇති තොරතුරු ලබා දීමට නොහැකි බවත් කාරුණිකව දන්වා සිටිමි."*

නම්කළ නිළධාරි විසින් ද පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2022.07.27 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත. එකී අභියාචනය කොමිෂන් සභාවේ RTIC Appeal /929/2022 ලෙස ලියාපදිංචි කර ඇත.
කොමිෂන් සභාවේ 2022.09.01 දිනැති අභියාචනා විභාගයේදී එළඹී එකගතාවය ප්‍රකාරව, පොදු අධිකාරියේ පොලිස් සැපයුම් කොට්ඨාශයේ අධ්‍යක්ෂ සැපයුම් විසින් 2022.09.08 දිනැතිව අභියාචකට ද පිටපත් සහිතව කොමිෂන් සභාව වෙත යොමු කරන ලද ලිඛිත කරුණු සැලකිරීම් මඟින් අභියාචකගේ තොරතුරු ඉල්ලීමේ අයිතම අංක 01, 02, 04, 05, 06 සහ 07 ට අදාළ බවට සඳහන් තොරතුරු සැපයීමක්

සිදු කර ඇති අතර එකී කරුණු දැක්වීමෙහි අභියාචකගේ තොරතුරු ඉල්ලීමේ අංක 08 සිට 14 දක්වා ඇති අයිතම සම්බන්ධයෙන් පොදු අධිකාරියේ ස්ථාවරය පහත පරිදි දක්වා ඇත.

*“ ....පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය මගින් කඳුළු වායු උණ්ඩ පිළිබඳව සිදුකරන ලද ඉල්ලීමට අනුව සැපයුම් කොට්ඨාශය විසින් අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදුකර, එම ඉල්ලීමට අදාළ භාණ්ඩ එම කොට්ඨාශය වෙත නිකුත් කිරිමට කටයුතු කර ඇත. එම භාණ්ඩ අවශ්‍ය පරිදි දිවයිනේ පොලිස් කොට්ඨාශ වෙත බෙදා හැරීමට හා ඊට අදාළ ලේඛන පවත්වාගෙන යාම පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය විසින් සිදු කරනු ලබයි.*

*ඉහත කොමිෂන් සභාවේ නියමය පරිදි ඉල්ලා ඇති තොරතුරු වලට අනුව ඉහත සඳහන් කර ඇති කාල සීමාව තුලදී කඳුළු ගෑස් වාර්ෂිකව භාවිතා කළ ප්‍රමාණය හා එම කඳුළු ගෑස් බෙදා හැරීමේ කටයුතු සම්බන්ධ ලේඛන සැපයුම් කොට්ඨාශය සතුව නොමැත.*

*එබැවින් ප්‍රශ්න අංක 08 සිට 14 දක්වා කරුණු වලට පිළිතුරු සැපයීම සඳහා විස්තර සැපයුම් කොට්ඨාශය සතුව නොමැති බැවින්, එය පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ තොරතුරු නිලධාරියාගෙන් ලබා ගැනීම සුදුසු බව නිරීක්ෂණය වේ.”*

පොදු අධිකාරියේ 2022.09.08 දිනැතිව උක්ත ලිඛිත සැලකිරීම් මගින් අභියාචක වෙත ලබා දී ඇති තොරතුරු සහ අතිරේක කරුණු දැක්වීම් සම්බන්ධයෙන් සිය ස්ථාවරය පැහැදිලි කරමින්, අභියාචක විසින් 2022.10.06 දිනැතිව කොමිෂන් සභාව වෙත ලිඛිත කරුණු දැක්වීමක් විද්‍යුත් තැපැල මගින් සිදු කරමින් දන්වා ඇත්තේ, සිය තොරතුරු ඉල්ලීමේ අයිතම අංක 01, 02, 04, 05, 06, 07, 09 සහ 12 යටතේ ඉල්ලා ඇති තොරතුරු සම්බන්ධයෙන් පොදු අධිකාරිය විසින් ලබාදී ඇත්තේ වැරදි සහගත, අසම්පූර්ණ හෝ නොමග යවන තොරතුරු සපයා ඇති බවත්, අයිතම අංක 08, 10, 11, 13 සහ 14 යටතේ ඉල්ලා ඇති තොරතුරු පොදු අධිකාරිය විසින් මෙතෙක් සපයා නොමැති බවත් ය.

තවද, 2022.09.14 දින කොමිෂන් සභාවේ පැවති අභියාචනා විභාගයේදී සිදුවූ එකගතාවය ප්‍රකාරව පොදු අධිකාරියේ නම්කළ නිළධාරී විසින් 2022.09.30 දිනැතිව කොමිෂන් සභාව වෙත පහත පරිදි ලිඛිත කරුණු දැක්වීමක් සිදුකර ඇත.

*“.....සමාජය හා සාමයික කේන්ද්‍රයේ තරිඳු ජයවර්ධන මහතා විසින් ශ්‍රී ලංකා පොලීසියට කඳුළු වායු මිලදී ගැනීම හා ඊට සම්බන්ධිත තොරතුරු ඇමුණුම 01 හි සඳහන් පරිදි ලබා දෙන ලෙස යොමු කරන ලද ඉල්ලීමට අනුව, මුල් අවස්ථාවේ දී තොරතුරු ලබා දීම තොරතුරු නිළධාරීන් විසින් ප්‍රතික්ෂේප කර ඇත.*

*කරුණු එසේ වුවත්, තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අභියාචනය, 2022.09.01 වන දින විභාග වූ අවස්ථාවේ දී ඉහත ඇමුණුම 01 හි සඳහන් ඡේද 01, 02, 04, 05, 06 හා 07 අනුව අයදුම් කර ඇති තොරතුරු සම්බන්ධයෙන් මේ වන විට සම්පූර්ණ වශයෙන් පිළිතුරු ලබා දී ඇති බවට තොරතුරු නිලධාරි විසින් මා වෙත වාර්තා කර ඇත.*

*නමුත්, මෙම කඳුළු ගෑස් මිලදී ගැනීම සම්බන්ධයෙන් ඉහත පරිදි ලබා දුන් තොරතුරු ප්‍රමාණවත් නොවන බව 2022.09.14 වන දින කොමිෂන් සභාවේ දී අභියාචක විසින් ප්‍රකාශ කර ඇත. ඒ අනුව, ඡේද 01, 02 හා 04 දක්වා තොරතුරු පහත පරිදි ලබා දෙමි.*

- *2017 වර්ෂයේ කඳුළු වායු උණ්ඩ 5000 ක් ප්‍රමාණයක් සඳහා රුපියල් 10,809,814.00 ක මුදලක්*
- *2019 වර්ෂයේ කඳුළු වායු උණ්ඩ 15000 ක් ප්‍රමාණයක් සඳහා රුපියල් 39,399,006.34 ක මුදලක්*
- *2020 වර්ෂයේ කඳුළු වායු උණ්ඩ 5000 ක් ප්‍රමාණයක් සඳහා රුපියල් 50,812,310.83 ක මුදලක්.*

*තවද ඡේද 05, 06 හා 07 ට අදාළව විමසීම් කර ඇති තොරතුරු අනුව ප්‍රසම්පාදන ගොනුවල සහතික පිටපත් ලබා දී ඇති අතර ඡේද අංක 07 ට අනුව ආයතනයන් වෙත ලංසු ප්‍රදානය කර ඇති ලිපි වල පිටපත් 03ක් ඇමුණුම් 02 (A), 02 (B) සහ 02 (C) යනුවෙන් ඉදිරිපත් කර සිටිමි.*

*කෙසේ නමුත් ඉහත ඇමුණුම 01 හි සඳහන් ඡේද අංක 08 සිට 14 දක්වා පොදු අධිකාරියේ ස්ථාවරය පහත පරිදි වේ.*

1. *ඡේද අංක 08 – 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 05 (1) (ආ) (1) හි ප්‍රතිපාදන අනුව තොරතුරු මුදා හැරීම ප්‍රතික්ෂේප කරමි.*
2. *ඡේද අංක 09 – කල් ඉකුත් වූ කඳුළු ගෑස් භාවිතා කර නොමැත.*
3. *ඡේද අංක 10 - අදාළ නොවේ.*
4. *ඡේද අංක 11 - අදාළ නොවේ.*
5. *ඡේද අංක 12 - ප්‍රහාරක අවස්ථා සංඛ්‍යාව 79 කි.*
6. *ඡේද අංක 13 - 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 05 (1) (ආ) (1) හි ප්‍රතිපාදන අනුව තොරතුරු මුදා හැරීම ප්‍රතික්ෂේප කරමි.*
7. *ඡේද අංක 14 - මේ වන විටත් අධිකරණයේ විවාදිතව නඩු කටයුතු පැවතීම හේතුවෙන් ගරු නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගැනීමෙන් තොරව තොරතුරු ලබා දීමට හැකියාවක් නොමැත...”*

අභියාචක විසින් කොමිෂන් සභාවේ 2022.10.06 දිනැති අතුරු නියෝගය ප්‍රකාරව, 2022.10.17 දිනැතිව A 01 සිට A 25 දක්වා වන ඇමුණුම් ද සමඟ කොමිෂන් සභාව වෙත අමතර ලිඛිත කරුණු දැක්වීමක් (විද්‍යුත් තැපැල මඟින්) සිදු කර ඇත. එකී 2022.10.17 දිනැති අමතර ලිඛිත කරුණු දැක්වීමෙන්, සිය තොරතුරු ඉල්ලීමේ ඇති එක් එක් අයිතමය යටතේ (තොරතුරු ඉල්ලීමේ අයිතම අංක 14 වම අදාළව) පොදු අධිකාරියේ තොරතුරු සැපයීම් සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය අභියාචක විසින් පැහැදිලි කර ඇති අතර ඒ අනුව අභියාචක විසින් දන්වා ඇත්තේ, සිය තොරතුරු ඉල්ලීමේ අයිතම අංක 01, 02, 04, 05, 06, 07, 09 සහ 12 යටතේ ඉල්ලා ඇති තොරතුරු සම්බන්ධයෙන් පොදු අධිකාරිය විසින් වැරදි සහගත, අසම්පූර්ණ හෝ නොමග යවන තොරතුරු සපයා ඇති බවත්, අයිතම අංක 08, 10, 11, 13 සහ 14 යටතේ ඉල්ලා ඇති තොරතුරු පොදු අධිකාරිය විසින් මෙතෙක් සපයා නොමැති බවත් ය. තවද, උක්ත කරුණු දැක්වීම මඟින් අභියාචක වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ, තම තොරතුරු ඉල්ලීමේ සඳහන් තොරතුරු සෘජුවම මහජන සුභසිද්ධිය හා සම්බන්ධ වන තොරතුරු වන බැවින් පනතේ 5 වන වගන්තිය යටතේ වන ව්‍යතිරේඛයන් මඟින් ඉහත තොරතුරු ඉල්ලීමට අදාළ තොරතුරු ආවරණය නොවන බවයි.

**සළකා බැලීම**

මෙම තොරතුරු ඉල්ලීම සිදුකරන ලද්දේ තොරතුරු දැනගැනීමේ අයිතියිවාසිකම් පනතේ 25(1) වගන්තිය යටතේ වන විශේෂ ප්‍රතිපාදන යටතේ වුවද ඒ පිළිබඳව තොරතුරු නිලධාරීන් තිදෙනාම

ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොමැත. ඉල්ලා ඇති තොරතුරු හා සමාජයේ එම දිනවල වඩාත් සංවාදයකට ලක්වූ තොරතුරු බැවින් තොරතුරු නිලධාරීන් පනතේ ප්‍රතිපාදන පිලිබඳව මෙයට වඩා උනන්දුවක් දැක්විය යුතුව ඇති බව කොමිෂන් සභාව අවධාරණය කර සිටි.

එසේම පොලිස් සැපයුම් කොට්ඨාශයේ තොරතුරු නිලධාරීන් විසින් 2022.07.01 දින දරණ ප්‍රතිචාර දැන්වීමේදී “විනාශ කල” බවට සදහන් කල ලේඛණ පසුව ලබාදී ඇති අතර එමගින් පොලිස් සැපයුම් කොට්ඨාශයේ තොරතුරු නිලධාරී විසින් 2022.07.21 දින සිදුකරන ලද ප්‍රතිචාරය කරුණු සොයාබැලීමකින් තොරව සිදුකරන ලද ප්‍රතිචාර දැක්වීමක් වන අතර එවැනි ප්‍රතිචාර කිසිසේත්ම ප්‍රසංශනීය නොවේ.

එසේම කොමිෂන් සභාව ඉදිරියේ පවතින අභියාචනයකදී පොදු අධිකාරිය නියෝජනය කරමින් සහභාගීවන නිලධාරීන් තම අංශයේ තොරතුරු නිලධාරි නොව සමස්ථ පොදු අධිකාරියම වෙනුවෙන් පෙනී සිටින බව කොමිෂන් සභාව විසින් සලකනු ලබයි.

කොමිෂන් සභාව ඉදිරියේ සිදුවූ අභියාචනා විභාග අවස්ථාවන්හිදී පොදු අධිකාරිය විසින් සිදුකරන ලද එකගතාවයන් පරිදී තොරතුරු ඉල්ලීම සදහා වන ප්‍රගතිය පහත පරිදී සිදුවී ඇති බව නිරීක්ෂණය වේ.

**තොරතුරු ඉල්ලීමේ අයිතම අංක - 1**

මෙම අයිතමයට අදාලව 2022.09.08 දින සැපයුම් අධ්‍යක්ෂකවරයා සපයා ඇති තොරතුරු අනුව 2017, 20්19 සහ 2022 යන අවස්ථා 3කදී කදුලු ගෑස් උණ්ඩ ගෙන්වා ඇති බවත් ඒ එක් එක් අවස්ථාවලදී ගෙන්වා ඇති උණ්ඩ පිලිබඳ සංඛ්‍යා ලේඛණ දක්වා ඇත. නමුත් එකී තොරතුරු සැපයීමේ වාර්ථාවේ අංක 7ට අදාලව සපයා ඇති ඇමුණුම් අංක 3හි අංක 20 යටතේ පෙර මිළදී ගැනීම් සහ තොග පිලිබද විස්තර යටතේ අංක ii යටතේ අවසන් වරට ටෙන්ඩරය ප්‍රදානය කල දිනය ලෙස 2012.07.07 දින දක්වා ඇත. ඒ අනුව 2012 වර්ෂයේ මිලදී ගැනීමට අදාල විස්තර අයිතම අංක 1 යටතේ දක්වා නැත.

**තොරතුරු ඉල්ලීමේ අයිතිම අංක - 2**

මෙම අයිතමයට අදාලව 2022.09.08 දින සැපයුම් අධ්‍යක්ෂකවරයා සපයා ඇති තොරතුරු අවස්ථා 3කදී කදුලු ගෑස් උණ්ඩ ගෙන්වා ඇති බවත් නමුත් එකී තොරතුරු සැපයීමේ වාර්ථාවේ අංක 7ට අදාලව සපයා ඇති ඇමුණුම් අංක 3හි අංක 20 යටතේ පෙර මිළදී ගැනීම් සහ තොග පිලිබද විස්තර යටතේ අංක ii යටතේ දක්වා ඇත්තේ අවසන් වරට ටෙන්ඩරය ප්‍රදානය කල දිනය ලෙස 2012.07.07 දින දක්වා ඇත. ඒ අනුව 2012 වර්ෂයේ මිලදී ගැනීමට අදාල විස්තර අයිතම අංක 2 යටතේ දක්වා නැත.

**තොරතුරු ඉල්ලීමේ අයිතිම අංක - 4**

මෙම අයිතමයට අදාලව 2022.09.08 දින සැපයුම් අධ්‍යක්ෂකවරයා සපයා ඇති තොරතුරු අනුව 2017, 20්19 සහ 2022 යන අවස්ථා 3කදී කදුලු ගෑස් උණ්ඩ ගෙන්වා ඇති බවත් ඒ එක් එක් අවස්ථාවලදී ගෙන්වා ඇති උණ්ඩ පිලිබඳ සංඛ්‍යා ලේඛණ දක්වා ඇත. නමුත් එකී තොරතුරු සැපයීමේ වාර්ථාවේ අංක 7ට අදාලව සපයා ඇති ඇමුණුම් අංක 3හි අංක 20 යටතේ පෙර මිළදී ගැනීම් සහ තොග පිලිබද විස්තර යටතේ අංක ii යටතේ දක්වා ඇත්තේ අවසන් වරට ටෙන්ඩරය ප්‍රදානය කල දිනය ලෙස 2012.07.07 දින දක්වා ඇත. ඒඅනුව 2012 වර්ෂයේ මිලදී ගැනීමට අදාල විස්තර අයිතම අංක 4 යටතේ දක්වා නැත. නැතහොත් 2012 වර්ෂයට අදාල පැහැදිලි කිරීම දක්වා නොමැත.

**තොරතුරු ඉල්ලීමේ අයිතිම අංක - 5**

අයිතම අංක 5 යටතේ ඉල්ලා ඇත්තේ කදුළු ගෑස් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දුන් ලේඛන මොනවාද? එලෙස කදුළු ගෑස් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැදවූ ලේඛන වල සහතික පිටපත් ලබා දෙන්න යනුවෙනි. නමුත් සපයා ඇත්තේ පොදු අධිකාරිය විසින් මිල ගනන් ඉදිරිපත් කරන ලෙස ප්‍රසිද්ධ කරන ලද ලේඛණ පමණි.

මිළදී ගැනීම සඳහා අනුමැතිය ලබාදුන් ලේඛණ ලබාදී නොමැත. එසේම 2012 වර්ෂයට අදාල ලේඛණ ලබාදීමක්ද සිදුකර නොමැත.

**තොරතුරු ඉල්ලීමේ අයිතිම අංක** - 6
මෙම අයිතමය යටතේ සපයා ඇති තොරතුරු අතර තාක්ෂණික ඇගයීම් කරද්දී සාම්පලවල අන්තර්ගතය පරික්ෂා කිරීම සිදුවන අතර තාක්ෂණික ඇගයුම් කමිටු වාර්තාවේ සාම්පල් වල අන්තර්ගතය පරික්ෂා කළ ලේඛන අන්තර්ගතව නැත.

**තොරතුරු ඉල්ලීමේ අයිතිම අංක** - 7
2012 වර්ෂණයට අදාල ව කඳුලු ගෑස් ලබාදීගැනීමේදී ටෙන්ඩර් ප්‍රදානය කල ලිපිවල සහතික කල පිටපත් ලබාදී නොමැත.

**තොරතුරු ඉල්ලීමේ අයිතිම අංක** - 8
මෙම අයිතකිමයට අදාල තොරතුරු ලබාදීම නම්කල නිලධාරී විසින් තොරතුරු පනතේ 5(1)(ආ)(i) යටතේ ප්‍රතිෂේප කර ඇත.

**තොරතුරු ඉල්ලීමේ අයිතිම අංක** - 9
මෙම අයිතමයට අදාල තොරතුරු සැපයීමක් සිදුකරමින් නම්කල නිලධාරී දක්වා ඇත්තේ කල්ඉකුත්වූ කඳුලු ගෑස් භාවිතාවක් සිදුකර නොමැති බවයි. අභියාචකගේ ස්ථාවරය වන්නේ එම තොරතුරු අසත්‍ය බවයි.

**තොරතුරු ඉල්ලීමේ අයිතිම අංක** - 10 සහ 11 ඉහත අයිතම අංක 9 හා සම්බන්ධ වේ. ඒ සඳහා ලබාදී ඇති ප්‍රතිචාරය වන්නේ අදාල නොවේ යන්නයි.

**තොරතුරු ඉල්ලීමේ අයිතිම අංක** - 12
මෙම අයිතමයට අදාල තොරතුර ලෙස ප්‍රහාර අවස්ථා ගනන 79 ක් ලෙස ප්‍රතිචාර දක්වා ඇත.

**තොරතුරු ඉල්ලීමේ අයිතිම අංක** - 13
තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 5(1)(ආ) (i) යටතේ ප්‍රතික්ෂේප කර ඇත.

**තොරතුරු ඉල්ලීමේ අයිතිම අංක** - 14
අධිකරණයේ පවතින නඩු කටයුත්තක් සම්බන්ධ බැවින් ගරු නීතිපතිතුමාගේ උපදෙස් ලබාදීමකින් තොරව ලබාදීමට හැකියාවක් නොමැති බව දක්වා ඇත.

පොදු අධිකාරිය වෙනුවෙන් 2022.09.30 දින පොලිස්පතිවරයා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ලබාදීමේ ලිපිය මගින් අභියාචකගේ තොරතුරු ඉල්ලීමේ සඳහන් අයිතම 8, 13 සහ 14 යන ඉල්ලීම් ප්‍රතික්ෂේප කර ඇති අතර අනෙක් අයිතමයන් සඳහා තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීමක් හෝ තොරතුරු සැපයීමකට ඇති බාධාවක් පිලිබදව කරුණු දක්වා නොමැත.

ඒ අනුව උක්ත තොරතුරු ඉල්ලීමේ අයිතිම 1, 2 සහ 4 සඳහා නැවත නිවැරදිව ගනනය කර තොරතුරු සැපයීමටද, අයිතම 5 සඳහා කඳුළු ගෑස් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දුන් ලේඛණවල සහතික පිටපත් සැපයීමටද අයිතම අංක 6 සඳහා තාක්ෂණිකව ඇගයීම් කරද්දී සාම්පලවල අන්තර්ගතය පරීක්ෂා කිරීම සිදුවන අතර තාක්ෂණික ඇගයුම් කමිටු වාර්තාවේ සාම්පලවල අන්තර්ගතය පරීක්ෂා කළ ලේඛණවල සහතික පිටපත් සැපයීමටද අයිතම අංක 7 සඳහා 2012 වර්ෂයට අදාල ව එකී තොරතුරු ඉල්ලීමේ සඳහන් තොරතුරු ලබාදීමටද කටයුතු කල යුතු බව කොමිෂන් සභාව තීරණය කරයි

තොරතුරු ඉල්ලීමෙ 8 වන අයිතමය ලෙස ඉල්ලා ඇත්තේ අදාල කාලය තුල භාවිතා කරන ලද කඳුලු ගෑස් ප්‍රමාණය කොපමණද යන්නය. මෙකී තොරතුරු සැපැයීම ප්‍රතික්ෂේප කරමින් පොදු අධිකාරියේ නම්කල නිළධාරී දක්වා ඇත්තේ තොරතුරු පනතේ 5(1)ආ(i) වගන්තියේ ප්‍රතිපාදන අනුව ප්‍රතික්ෂේප කරන බවයි. නමුත් මෙම තොරතුරු මහජන උන්නතියට අදාල තොරතුරක් බව අභියාචක විසින් 2022.10.17 දින දරණ ලිඛිත සැලකිරීම් මගින් කරුණු දක්වා ඇත. විශේෂයෙන්ම අභියාචකගේ චෝදනාව වන්නේ ජනතාව විසුරුවා හැරීම සඳහා පොලිසිය විසින් කල් ඉකුත් වූ කඳුළු ගෑස් භාවිත කර ඇති බවයි. කඳුළු ගෑස් ප්‍රහාරයන්ට ලක්වූ පුද්ගලයෙකු මියයාමද, ප්‍රතිකාරවලට ලක්වූ පුද්ගලයන්ගේ වෛද්‍ය වාර්තා සම්බන්ධ කරුණු ද අභියාචක විසින් ඉදිරිපත් කර ඇත. මේ අනුව මෙම තොරතුර නිදහස් කලයුතුද නැද්ද යන්න තීරණය කිරීමේදී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිලිබඳ පනතේ 5(4) වගන්තිය කෙරෙහිද මෙම කොමිෂන් සභාවේ විශේෂ අවධානය යොමු කල යුතුව ඇත. පොදු අධිකාරිය විසින් භාවිතා කරන ලද කඳුළු ගෑස් ප්‍රමාණය සම්බන්ධ තොරතුරු, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 5(4) වගන්තිය ප්‍රකාරව, සෘජුවම මහජන සුබසිද්ධිය හා සම්බන්ධ වන තොරතුරු වන බව අපගේ නිගමනය වේ. නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා කඳුළු ගෑස් භාවිතා කිරීම රාජ්‍යය විසින් සිදු කරන නීත්‍යානුකූල ක්‍රියාවලියක් බැවින් එහි කිසිදු රහස්‍යභාවයක් නොතිබිය යුතුය. ඒ අනුව, තොරතුරු පනතේ 5 (1)ආ(i) වගන්තිය, මෙම තොරතුරු මුදා හැරීමට බාධාවක් ලෙස ක්‍රියාත්මක වන බව පිළිගත නොහැකි බව අපි තීරණය කරමු.

අයිතම 9 10 11 සහ 12 සඳහා පොදු අධිකාරිය තොරතුරු ලබාදී ඇති අතර එම තොරතුරු අසත්‍ය තොරතරු බවට අභියාචක විසින් කරුණු දක්වා තිබේ. අසත්‍ය තොරතුරු සැපයීම පනතේ 39 වන වගන්තිය යටතේ වරදක් වන බැවින් ඒ සඳහා කරුණු ඉදිරිපත් කිරීමටද පනතේ ප්‍රතිපාදන යටතේ විමර්ශණයක් ඉල්ලා සිටීමටද අභියාචක වෙත අයිතිය ඇත.

අයිතම 13 සම්බන්ධයෙන් පොදු අධිකාරියේ ස්ථාවරය වී ඇත්තේ එම තෙරතුරු සැපයීම 5(1)ආ(i) වගන්තිය යටතේ ප්‍රතිකේෂ කරන බවයි. එකී අයිතමයෙන් ඉල්ලා ඇත්තේ එලෙස එල්ල කළ අවස්ථාවලදී භාවිත කරන ලද කඳුළු ගෑස් ප්රමාණයන් මොනවාද? ඒ බව සඳහන්වන ලේඛනවල සහතික පිටපත් ලබා දෙන්න යනුවෙනි මෙම තෙරතුරු ඉල්ලීම අයිතිම 12 සමග සෘජුව සම්බන්ධ වන අතර ඒ අනුව මෙම සංඛ්‍යා ලේඛන ඉල්ලා ඇත්තේ 2022 මාර්තු 31 සිට 2021 ජූනි මාසය දක්වා කාල කාලපරිච්ඡේදයක් සම්බන්ධයෙන් වේ. මෙම තොරතුරු වලට අදාල කාල පරිච්ඡේදයේ කඳුලු ගෑස් ප්‍රහාරයන් සම්බන්ධයෙන් සමාජයේ දැඩි සාකච්ඡාවට භාජනය වූ අතර එම කාල පරිච්ඡේදය තුල සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීම මගින් පනතේ 5 (1) ආ (i) වගන්තියේ ප්‍රතිපාදනයට සිදුවන බලපෑම පිළිබඳව පොදු අධිකාරිය පැහැදිලි කිරීමක් සිදුකර නොමැත. එසේම මෙම තොරතුර මහජන උන්නතියට අදාල කරුණක් බැවින් පනතේ 5(4) වගන්තියේ ප්‍රතිපාදන කෙරෙහිද කොමිෂන් සභාවේ අවධානය යොමුවිය. ඒ අනුව අයිතම 13 සඳහා තොරතුරු නිදහස් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ පොදු අධිකාරියේ නම්කල නිලධාරිගේ තීරණය සමග කොමිෂන් සභාවට එකග විය නොහැක. එබැවින් තොරතුරු ඉල්ලීමේ අයිතම අංක 13 ට අදාල තොරතුරු නිදහස් කල යුතු බව අප තීරණය කරමු.

තොරතුරු ඉල්ලීමේ අයිතම 14 සම්බන්ධයෙන් පොදු අධිකාරියේ නම්කල නිලධාරිගේ ස්ථාවරය වී ඇත්තේ අධිකරණයේ නඩු කටයුත්තක් පවතින බැවින් ගරු නීතිපතිවරයාගෙන් උපදෙස් ලබාගැනීමෙන් තොරව එම තොරතුරු මුදාහැරිය නොහැකි බවත්ය. අයිතම 14 මගින් ඉල්ලා ඇති තොරතුර වන්නේ, එම අවස්ථාවලදී භාවිත කළ කඳුළු ගෑස් කුමන වසරවල මිලදී ගත් කඳුළු ගෑස් ද ? ඊට අදාල සියලු ලේඛනවල සහතික පිටපත් ලබා දෙන්න යන්නය මෙම තොරතුරද අයිතම 9 හා සම්බන්ධ බැවින් ඉල්ලා ඇති තොරතුරු 2022 මාර්තු 31 සිට 2021 ජූනි මාසය දක්වා කාල පරිච්ඡේදයක් සම්බන්ධයෙන් වේ. මෙම තොරතුර ප්‍රතිකේෂ කිරීම සඳහා නම්කල නිලධාරී විසින් පනත යටතේ වන කිසිම විධිවිධානයක් දක්වා නොමැත. එසේම නඩු කටයුත්ත කුමක්ද යන්න පිලිබඳව සහ මෙම තොරතුරු වලට එම නඩු කටයුත්තේ අදාලත්වය පිලිබඳව කිසිදු කරුණු දැක්වීමක් ද සිදුකර නොමැත. මෙම අභියාචනා විභාගය අවසන් කල 2022 ඔක්තොර්බර් 6 වන දින අතිරේක ලිඛිත දේශන සඳහා දෙපාර්ශවයටම 2022.10.17

වන දින තෙක් අවස්ථාව ලබාදුන් නමුත් එම අවස්ථාවේදීද පොදු අධිකාරිය විසින් මේ පිළිබඳව පනතට අනුකූල කරුණු දැක්වීමක් සිදුකර නොමැත. පනතේ 32(4) වගන්තිය අනුව කොමිෂන් සභාව ඉදිරියේ පවතින අභියාචනයකදී පොදු අධිකාරිය පනතට අනුව ක්‍රියාකර ඇති බව ඔප්පු කිරීමේ භාරය පොදු අධිකාරිය වෙත පැවරේ. ඒ අනුව මෙම අයිතමයේ සඳහන් තොරතුරු ප්‍රතික්ෂේප කිරීමේ තීරණය සාධාරණීකරණය කිරීමට පොදු අධිකාරිය සමත් වී නොමැති බව තීරණය කරමු.

ඒ් අනුව අයිතම අංක 14 ට අදාලව පෙ ොදු අධිකාරියේ නම්කල නිලධාරිගේ තීරණය ප්‍රතික්ෂේප කරමින් එම අයිතමයට අදාල තොරතුරු අභියාචක වෙත ලබාදිය යුතු බව තීරණය කරමු.

මේ අනුව 2022 ජූලි 17 වන දින තොරතුරු ඉල්ලීමේ අයිතම 01, 02, 04, 05, 06, 07 සහ 08 දක්වා අයිතමයන් සම්බන්ධයෙන් මෙම තීරණයේ ඉහත වගන්ති වලින් දක්වා ඇති තොරතුරුද එකී තොරතුරු ඉල්ලීමේ අයිතම 12, 13 සහ 14 අයිතම වලට අදාල ව එම තොරතුරු ඉල්ලීම් පරිදී තොරතුරුද 2022 නොවැම්බර් මස 14 වන දිනට පෙර කොමිෂන් සභාවටද පිටපත් සහතිතව අභියාචක වෙත ලබාදිය යුතු බවට තීරණය කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණයට අනුකූලව ක්‍රියා කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම්, තොරතුරු නිලධාරිට සහ පොදු අධිකාරියට එරෙහිව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව නියමිත මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පැවරීමට ක්‍රියාකළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිලධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

මෙම අභියාචනය අවසන් කරනු ලැබේ.

.............................................................
විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති

.............................................................
විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්

.............................................................
නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්

.............................................................
නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

.............................................................
මොහොමඩ් නහියා - කොමසාරිස්

Gmail **Tharindu Jayawardhana <tharindu.rti@gmail.com>**

---

## Tear Gas RTI - පනතේ 39 යටතේ නඩු පවරණ ලෙස ඉල්ලා සිටීම - 927/22, 928/22 සහ 929/22

2 messages

---

**Tharindu Jayawardhana** <tharindu.rti@gmail.com> Thu, Jan 5, 2023 at 12:40 AM
To: rticommission16@gmail.com, chairman@rtic.gov.lk
Cc: Jagath Liyana Arachchi <jagathliyanarachchi@gmail.com>, rtikishalipintojayawardena@gmail.com, Legal Branch - RTIC <legal@rtic.gov.lk>, lasanthiertic@gmail.com, Lasanthie Wimalasurendra <rtilasanthie@yahoo.com>, jagathrtic@gmail.com, Kishali Pinto-Jayawardena <kishalipintojayawardena@gmail.com>, CSR RTI <csr.rti281@gmail.com>, Suren Perera <suren.perera5@gmail.com>, Manushika Cooray <manushikacsr@gmail.com>, Ruki <rukiiiii@gmail.com>, Director - Supplies Division <dir.supplies@police.lk>, Police Supplies <slpolice.supplies@gmail.com>, sdig.admin@police.lk, Director - Field Force Headquarters <commandantffhq@police.gov.lk>

සභාපති සහ කොමසාරිස්වරුන්,
තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව.

සභාපතිතුමනි, කොමසාරිස්වරුනි,

**<u>තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 යටතේ නඩු පවරණ ලෙස ඉල්ලා සිටීම</u>**

ශ්‍රී ලංකා පොලිසිය කඳුළු ගෑස් මිලදී ගැනීම සහ කඳුළු ගෑස් භාවිත කිරීමට අදාලව කළ තොරතුරු ඉල්ලීම්වලට අදාල 927/22, 928/22 සහ 929/22 දරණ අභියාචනා විභාගය අවසන් කළ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඒ'ට අදාලව සියලුම තොරතුරු මුදා හරින ලෙසට තීන්දු කළේය.

එම තීන්දුව අනුව ඇතැම් තොරතුරු ලැබුණ ද ඇතැම් තොරතුරු ශ්‍රී ලංකා පොලිසිය විසින් මෙතෙක් ලබාදී නැත. අප විසින් ඉල්ලා සිටි අයිතමයන්ට අදාලව වර්තමාන තත්ත්වය පහතින් සඳහන් කරමු.

**01 අයිතමය**
ලැබුණු තොරතුරුවලින් සෑහීමකට පත්වෙමි.

**02 අයිතමය**
ලැබුණු තොරතුරුවලින් සෑහීමකට පත්වෙමි.

**04 අයිතමය**
ලැබුණු තොරතුරුවලින් සෑහීමකට පත්වෙමි.

**05 අයිතමය**
අසම්පූර්ණ සහ/හෝ නොමග යවන තොරතුරකි.

**06 අයිතමය**
අසම්පූර්ණ සහ/හෝ නොමග යවන තොරතුරකි.

**07 අයිතමය**
අසම්පූර්ණ සහ/හෝ නොමග යවන තොරතුරකි.

**08 අයිතමය**
අසම්පූර්ණ සහ/හෝ නොමග යවන තොරතුරකි.

**09 අයිතමය**
ව්‍යාජ, අසම්පූර්ණ සහ/හෝ නොමග යවන තොරතුරකි.

**10 අයිතමය**
ව්‍යාජ, අසම්පූර්ණ සහ/හෝ නොමග යවන තොරතුරකි.

**11 අයිතමය**
ව්‍යාජ, අසම්පූර්ණ සහ/හෝ නොමග යවන තොරතුරකි.

**12 අයිතමය**
ව්‍යාජ, අසම්පූර්ණ සහ/හෝ නොමග යවන තොරතුරකි.

**13 අයිතමය**
ව්‍යාජ, අසම්පූර්ණ සහ/හෝ නොමග යවන තොරතුරකි.

**14 අයිතමය**
ව්‍යාජ, අසම්පූර්ණ සහ/හෝ නොමග යවන තොරතුරකි.

ඉහත පරිදි පොදු අධිකාරිය අදාල තොරතුරු ලබා නොදීම, ව්‍යාජ/අසත්‍ය තොරතුරු ලබාදීම, අසම්පූර්ණ තොරතුරු ලබාදීම සහ නොමග යවන තොරතුරු ලබාදීම සිදු කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් ආරම්භ කරන ලෙසත්, එම පරීක්ෂණයෙන් පසු පනතේ 39 වැනි වගන්තිය යටතේ නිසි බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයේ තොරතුරු නිලධාරීන්ට, තොරතුරු ලබාදීම වැලැක්වූ නිලධාරීන්ට සහ පොදු අධිකාරියට එරෙහිව නඩු පවරන ලෙසත් ඉල්ලා සිටිමු.

මේ සම්බන්ධයෙන් කඩිනම් විමර්ශනයක් ඇරැඹීමෙන් පසු සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කළ හැකිය.

ස්තුතියි.

**Tharindu Jayawardhana**
0710 66 14 17 / 0777 66 14 17
tharindu.rti@gmailcom
www.medialk.com
https://www.youtube.com/c/Medialkdotcom

---

**Lasanthie Wimalasurendra** <lasanthiertic@gmail.com> Thu, Jan 5, 2023 at 8:42 AM
To: Tharindu Jayawardhana <tharindu.rti@gmail.com>

Noted
[Quoted text hidden]